# සිංහල බෞද්ධ මතවාදය තුළ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව : පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ භික්ෂූන්ගේ සමාජ- දේශපාලන ක්‍රියාකාරකම් ඇසුරින්

**නිශාන්ත හෙට්ටිආරච්චි**

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය තුළ තියුණු වාද-විවාදයන්ට පාත්‍ර වී ඇති බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව බොහෝ අධ්‍යයන කරනු ලැබ ඇත (Deegalle 2006, Bartholomeusz & De Silva 2001, Seneviratne 1999, Tambiah 1992, Gombrich & Obeysekera 1988). බෞද්ධ භික්ෂූව පිළිබඳ සිදුකළ සමහර අධ්‍යයන මගින් ඉදිරිපත් කළ මතය වනුයේ ශ්‍රී ලංකාවාසී සිංහල බෞද්ධ භික්ෂූන්ගෙන් වැඩි පිරිසක් සිංහල-බෞද්ධ දෘෂ්ටිමය ස්ථාවරයක් දරන බවත්, එය පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ ඇතැම් දේශපාලන පක්ෂ වල කේන්ද්‍රීය මතවාදය බවට පත්ව ඇති බවත් ය (Dewasiri 2016, De Votta 2007, Uyangoda 2007, Seneviratne 1999). මේ පසුබිම තුළ ඔවුන් දේශපාලන බලය ලබා ගැනීම සඳහා එය ප්‍රචාරක උපකරණයක් ලෙස යොදා ගන්නා ආකාරය හඳුනාගත හැකිය. බෞද්ධ භික්ෂූන් විසින් අනුගමනය කරන මෙම සිංහල-බෞද්ධ මතවාදය සමගින් මතුව තිබෙන ජනවාර්ගික සහ ආගමික ගැටුම් ශ්‍රී ලංකාව මෑත ඉතිහාසයෙහි මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුවක් බවට සැකයක් නැත. එසේම භික්ෂුවගේ කාර්යභාරය සාකච්ඡාවට ලක් කිරීම සම්බන්ධයෙන් සලකා බලන විට මෙය වර්තමානයේදී ශ්‍රී ලංකික භික්ෂූන් වෙත එල්ලව ඇති ප්‍රධාන

අභියෝගවලින් එකක් බවට ද සැකයක් නැත. එබැවින් වර්තමානයේ භික්ෂුවගේ සමාජ හා දේශපාලන කාර්යභාරය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීම දේශපාලන වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් ද එකසේ වැදගත් වේ. මෙම අධ්‍යයනය පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ මතවාදය අනුගමනය කරන ලද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව නිවැරදි අවබෝධයක් සඳහා තබන පියවරකි.

සිංහල-බෞද්ධ දෘෂ්ටියෙහි අභාෂය ලැබූ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන භූමිකාව සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති කථිකාවෙහි ප්‍රධාන අංශ දෙකක් මෑත කාලයේදී විද්වතුන් හඳුනා ගෙන තිබේ (උයන්ගොඩ, 2018). ඉන් පලමු අදහසින් ප්‍රකාශ වන්නේ පශ්චාත්-නිදහස් අවධියේ මුල් කාලයේ සිට දේශපාලන හා සමාජ කටයුතු වල නිරතව සිටි භික්ෂූන් වහන්සේලා විසින් සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිය ප්‍රවර්ධනය කළ බවත්, එය පශ්චාත්-නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මතවාදය බවට පත්ව ඇති බවත්, එමගින් සිංහල-බෞද්ධ අනන්‍යතාවය රටෙහි ජීවත්වන සුළුතර ජනවර්ගවල අනන්‍යතාවලට වඩා ඉහළින් ඔසවා තබා ඇති බවත් ය. දෙවැනි අදහසින් ප්‍රකාශ වන්නේ එම සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන ක්‍රියාමාර්ග, පශ්චාත් සිවිල් යුධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ මතවාදය නියෝජනය කරන ප්‍රධාන දේශපාලන පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ දේශපාලන අභිලාෂයන් සපුරා ගැනීම සදහා යොදාගත් බවත් එහි ප්‍රතිඵල වශයෙන් රාජපක්ෂ රෙජීමය ශ්‍රී ලංකාවේ සුළුතර ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් කෙරෙහි පිටස්තරවාදී ආකල්ප හා චර්යාවන් ගොඩනගා ගෙන ඇති බවත් ය.

මෙම අධ්‍යයනය විමසීමට ලක් කරන්නේ ශ්‍රී ලංකාවේ පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව ඇගයුම් කරන්නටය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ මුල් කොටසින් කරනු ලබනුයේ ශ්‍රී ලංකාවේ භික්ෂු දේශපාලනය පිලිබදව ප්‍රකාශිත සාහිත්‍ය විමර්ශනයට ලක් කිරීමයි. ඉන් අනතුරුව පර්යේෂණ අරමුණු හා ක්‍රමවේදය පැහැදිලි කර, පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව තුලින් ඉස්මතු වන විවිධ පැතිකඩයන් සහ එමගින් පෙන්නුම් කරන ලද භික්ෂු දේශපාලනයේ විවිධ දිශානතීන් විග්‍රහ කරනු ලැබේ. එහිදී ශ්‍රී ලංකාවේ භික්ෂු දේශපාලනය පිළිබද ප්‍රකාශිත සාහිත්‍ය මෙන්ම සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අදහස් විමසීමට ලක් කරනු ලැබේ. අවසාන වශයෙන් අධ්‍යයනයට ලක් කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව ඇසුරින් එළඹෙන නිගමන සාකච්ඡා කර තිබේ.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව දීර්ඝ ඉතිහාසයක් මුළුල්ලේ පැවත එන්නකි. භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාවේ වැදගත් අවස්ථාවක් වන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබුන රාජ්‍ය අනුග්‍රහයයි. මේ පිළිබද අධ්‍යයනය කළ අය විසින් හෙළිදරව් කරන ලද්දේ දේශපාලන නායකයන් නිතිපතා භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් වැදගත්වූ උත්සවවල ප්‍රධාන චරිත බවට පත්ව තුබූ බවයි (ලියනගමගේ, 2010, Malalgoda 1976, Obeysekara 1972). සම්ප්‍රදායක් ලෙස භික්ෂූන් වහන්සේලා අතර විවිධ නිකායන්හි

අභිනවයෙන් පත් වූ මහ නාහිමිවරුන්ට අක්තපත්‍ර පිරිනැමුවේ රටේ ජනාධිපතිවරයා හෝ අගමැතිවරයාය. බොහෝ දේශපාලනඥයන් රටේ පාලන ක්‍රියාවලියේ වගකීම් භාරගැනීමෙන් පසු ප්‍රධාන සංඝයා වහන්සේලාගේ බැහැදැකීමට ගියහ. එපමණක්ද නොව, අනෙකුත් දේශපාලන ප්‍රභූ සාමාජිකයන්ද එවැනි ක්‍රියාවලට නොවරදවාම සහභාගී වූහ. බෞද්ධ භික්ෂූන් සහ දේශපාලන බලය අතර ඇති සමීප සබඳතාව වඩාත් පැහැදිලිව ප්‍රකාශ වන්නේ අලුතින් පත් වූ ආණ්ඩුවල ප්‍රධානීන් මහනුවර ප්‍රධාන භික්ෂූන් වහන්සේලාගේ ආශිර්වාදය ලබා ගැනීමේ සම්ප්‍රදාය තුළ ය. එපමණක් නොව දේශපාලනඥයෝ සිංහල බෞද්ධ රාජ්‍යයේ පරම සංකේතය වන දළදාවේ ආශිර්වාදය ද පතති. එබැවින් මේ සියලු කාරණා වලින් පැහැදිලි වන්නේ ඉතිහාසය මුළුල්ලේම භික්ෂූන් නොමද රාජ්‍ය අනුග්‍රහය ලබා ගනිමින් ස්වකීය සමාජ හා දේශපාලන කටයුතු පවත්වා ගෙන ගිය ආකාරයයි.

මහාවංශය බෞද්ධ භික්ෂූන් සමඟ රාජ්‍යය පවත්වා ගෙන ගිය සබඳතාවල ස්වභාවය, අන්තර්ගතය සහ රටේ පාලන කටයුතු සඳහා ඔවුන්ගේ මැදිහත්වීම සඳහන් කර ඇත (Gombrich & Obeysekera 1988, Kemper 1991, Amunugama 1985). එක් එක් රජවරුන් සහ රාජවංශයන් සමඟ භික්ෂූන් වහන්සේලාට ඇති සුහද සබඳතාව පමණක් නොව ගැටුම් ද එහි සටහන් කර තිබුණි. එහෙත් මහාවංස කතුවරයා දේවානම් පියතිස්ස රාජ සමයේ සිට යටත් විජිත සමය දක්වා සංඝයා වහන්සේලාට හිමි වූ තත්ත්වය විස්තර කර ඇත්තේ අතිශයෝක්තියෙනි (සෙනවිරත්න, 2001: 33-44). මෙයින් පැහැදිලි වන්නේ රාජ්‍යය නමැති නූතන දේශපාලන ආයතනයේ පැනනැගීමත් සමඟ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය ගොඩනැගීමට මහාවංස කතුවරයා කටයුතු කළ ආකාරයයි.

සමහර විද්වතුන් සංඝ සමාජය අතර පවත්නා බෙදීම සහ ඒවායේ දේශපාලන හා සමාජීය බලපෑම් කෙරෙහි අවධානය යොමු කර ඇත (Abeysekera 2002, Wickremerathne 1995). ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේ ප්‍රධාන නිකායන් තුනකට බෙදී ඇති අතර, එයින් සියම් නිකාය එහි විශාලතම හා පැරණිතම නිකාය වේ. සියම් නිකාය ශ්‍රී ලංකාවේ ප්‍රභූ පැලැන්තියේ සංඝයා වහන්සේලා නියෝජනය කරන නිකාය වන නිසා ඔවුන්ට රජයේ දේශපාලනඥයින්ගෙන් ඉහළ වරප්‍රසාද හිමිවී තිබේ. එසේම ඔවුන්ට ශ්‍රී ලංකාවේ බෞද්ධයින්ගේ මුදුන් මුල්කඩ බඳු වූ ශ්‍රී දළදා මාලිගාවේ භාරකාරත්වය ලැබී තිබේ. දෙවැනි විශාලතම භික්ෂු කණ්ඩායම අමරපුර නිකාය වන අතර එය සිංහල සමාජයේ ගොවිගම නොවන නිර්ප්‍රභූ කුල කණ්ඩායම් වලින් සැකසී ඇත. සිංහල බෞද්ධ ජාතිකවාදයේ ප්‍රකාශකයන් බවට පත්වූ සංඝයා වහන්සේලා සැලකිය යුතු පිරිසක් අමරපුර නිකාය නියෝජනය කරති ( Hettiaarachchi 2017). අමරපුර නිකායේ හිටපු උත්තරීතර මහා නායක මඩිහේ පඤ්ඤාසීහ හිමි සිංහල බෞද්ධ ජාතිකවාදයේ ප්‍රමුඛ චරිතයක් විය (Senevirathne 1999). භික්ෂු භූමිකාව ගැන අධ්‍යයනය කළ මුල් පරම්පරාවේ විද්වතුන් ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වූයේ සංඝයා වහන්සේලා අතර භේදයට හේතු, ඒවායේ සමාජ-දේශපාලන ප්‍රතිවිපාක සහ ශ්‍රී ලාංකේය සමාජය සමඟ ඔවුන්ගේ සබඳතාවල ස්වරූපය පරික්ෂා කිරීම කෙරෙහිය (Kempers 1984, Gembrich & Obeysekera 1988, Malalgoda 1976).

ශ්‍රී ලාංකේය දේශපාලනයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය පිළිබඳ සිදුකළ පර්යේෂණ අතුරින් එච්.එල්.සෙනවිරත්නගේ The Work of Kings: The New Buddhism in Sri Lanka (රජවරුන්ගේ කාර්යයඃ ශ්‍රී ලංකාවේ නව බුද්ධාගම) (1999)

යන්න සුවිශේෂී අධ්‍යයනයකි. එය සංඝ සමාජය පිළිබඳව සිදුකරන ලද අනෙකුත් අධ්‍යයනයන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වූයේ නූතන ශ්‍රී ලංකාවේ සමාජ හා දේශපාලන කාර්යෙහි නිරත භික්ෂූන්ගේ නව භූමිකාව කෙරෙහි ඔහුගේ අවධානය යොමු වූ බැවිනි. ඔහු විසිවැනි සියවසේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ භූමිකාව කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කර ඇත ( Senavirathna 1999: 25). එසේම සෙනවිරත්නගේ අධ්‍යයනය මගින් බෞද්ධ නූතනවාදය පැනනැගිමේ පුළුල් රාමුව සාකච්ඡා කර තිබේ. ඒ අනුව යටත් විජිත සමයේ ඇතිවූ සුවිශේෂී වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම නවීකරණය කිරීම සඳහා නැගී එන නව පංතියක් ඉදිරියට පැමිණීම සිදුවිය. මේ නව පංතියේ මූලික ලක්ෂණය වූයේ නූතන ධනේශ්වර ක්‍රමයේ භාවිතයන් තුළින් මතුවන අභියෝගවලට මුහුණ දීම සඳහා බෞද්ධයන් විසින් රෙපරමාදු ආගමේ අංගයන් සහ උපායමාර්ග වැළඳ ගැනීමයි (Gombrich & Obeysekera 1988: 202-240). ඔබේසේකර (1972) මෙම ක්‍රියාවලිය හැඳින්වූයේ "ප්‍රොතෙස්තන්ත බුදුදහම" යනුවෙනි. එමගින් ක්‍රිස්තියානි ධර්මය ඇදහිල්ලක් ලෙස ප්‍රතික්ෂේප කරන අතරම බෞද්ධයෝ දැනුවත්ව තම ආගම ආදර්ශයට ගනිමින් ස්වකීය ජීවිතය ඒ අනුව හැඩගස්වා ගත්හ. මේ අයුරින් බුදුදහම නවීකරණය කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් භික්ෂූන් වහන්සේලාට නව භූමිකාවක් නිර්මාණය කෙරිණි.

බෞද්ධ භික්ෂුත්වය පිළිබඳ නව සංකල්පයක් 1930 සහ 1940 ගණන් වලදී වර්ධනය විය. එය වල්පොල රාහුල හිමි (1907-97) ප්‍රමුඛ විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලදී. වල්පොල රාහුල හිමි විසින් 1946 දී ප්‍රකාශයට පත් කරන ලද 'The Heritage of the Bhikkhu' (භික්ෂුවගේ උරුමය) එහි අත්පොත විය. සෙනවිරත්න

(1999) විසින් තර්ක කරන පරිදි එය ශ්‍රී ලාංකේය ථෙරවාදී බුද්ධාගමේ මෑත ඉතිහාසයේ වෙනත් කිසිදු ප්‍රකාශනයකට වඩා බලපෑම් කර ඇත. වල්පොල රාහුල හිමිට අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛ කාර්යභාරය දේශපාලනික එකක් විය (රාහුල, 2012: 120-122). දේශපාලන භික්ෂුවගේ ක්‍රියාකලාපය ස්වාර්ථය සමඟ කිසිදු සම්බන්ධයක් නොමැති බවත්, ඔවුන්ගේ න්‍යාය පත්‍රය ආත්මාර්ථකාමී චර්යාවෙන් ඔබ්බට ගිය සේවයක් බවත් එය බලලෝභී දේශපාලකයන්ගේ අරමුණු සමඟ ගැටෙන බවත් උන්වහන්සේ තර්ක කළේය (රාහුල, 2012: 1-5). මෙම චින්තන මාර්ගය අනුගමනය කළ එම භික්ෂූන් තමන් දේශපාලන ක්ෂේත්‍රයේ නීත්‍යානුකූල ක්‍රියාකාරීන් ලෙසත්, ශ්‍රී ලංකාවේ බුදු සමයේ ආරක්ෂකයින් ලෙසත් දුටුවේය. කෙසේ වෙතත්, එදිනෙදා දේශපාලනයේ ප්‍රායෝගික යථාර්ථයන් සමඟ කටයුතු කිරීමේදී ඔවුන් බොහෝ හානි සිදුකර ගත්තේය.

සමස්තයක් ලෙස භික්ෂුවගේ උරුමය කෘතිය මගින් වල්පොල රාහුල හිමියන් ඉදිරිපත් කළ මතවාදය මගින් භික්ෂූන්ට ගිහි අධ්‍යාපනය නිර්දේශ කිරීම, සාම්ප්‍රදායික පූජා, චාරිත්‍ර විධි වලින් ඔවුන් ඈත් කිරීම සහ වර්තමානයේදී භික්ෂූන්ට සිය වෘත්තිය ලෙස සමාජ සේවය යෝජනා කිරීම සහ එමගින් භික්ෂූන් දේශපාලනය වෙත යොමු කිරීම සඳහා පෙළඹීම යන අංශ අවධාරණය කෙරිණි. රාහුල හිමිගේ භික්ෂුවගේ උරුමය රචනාව සම්බන්ධයෙන් සෙනවිරත්නගේ අවසාන නිගමනය වූයේ භික්ෂුවගේ උරුමය ප්‍රකාශනය භික්ෂු දේශපාලනයේ රැඩිකල් වෙනසක් ඇති කිරීමට මඟ පෑදූ බවයි (Senewirathne, 1999: 185-186).

ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් සමයේ ආරම්භයේ පැවති දේශපාලන වාතාවරණය ගැන සිංහල බෞද්ධ කණ්ඩායම්වල විශේෂිත දුක්ගැනවිල්ලක් විය (Phadnis 1976, Malalgoda 1972, Wriggins 1960).

එමඟින් ප්‍රකාශ වුයේ නිදහස් ලංකාවේ දේශපාලන බලය හිමිකරගත් ආණ්ඩු යටත් විජිත යුගයට පෙර බුද්ධාගම හිමිකරගත් බලගතු ස්ථානය නිසි ලෙස ප්‍රතිෂ්ඨාපනය කර නොතිබුණු බවයි. එම පසුබිම තුළ රාජ්‍යය තුළ බුද්ධාගමේ විධිමත් භූමිකාව වැඩිදියුණු කිරීම සඳහා විශ්වාසය තැබිය හැකි වැඩ පිළිවෙලක් කෙරෙහි සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලනඥයන්ගේ අවධානය යොමු විය (Thambiah, 1992: 30-41). මේ අවධියේ එම අරමුණෙන් යුතුව කටයුතු කළ දේශපාලන කණ්ඩායමක් වුයේ මහජන එක්සත් පෙරමුණයි. ඔවුන් 1956 දී බලයට පත්වීමත් සමඟ සිංහල බෞද්ධ ජනතාවගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් වඩාත් පැහැදිලිව ප්‍රකාශ විය. මේ සඳහා බලපෑම් කළ එක්සත් භික්ෂු පෙරමුණ ද ඊට සමගාමීව බිහි විය (Weerawardana 1960). එය නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලන අරමුණක් සහිතව බිහි වූ පළමු භික්ෂු සංවිධානය වේ. එක්සත් භික්ෂු පෙරමුණ 1956 මැතිවරණයේදී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිංහල පමණක් ප්‍රතිපත්තිය හා බුදුදහම ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධ සටන් පාඨය සඳහා පූර්ණ සහයෝගය ලබා දුන්නේය (Thambiah, 1992: 30-41). එම වසරේම පවත්වන ලද බුදුන් වහන්සේගේ පිරිනිවන් පෑමේ 2500 වැනි සංවත්සරය ද ඔවුන්ගේ අරමුණට උපකාර විය (Obeysekera 1972). එම සැමරුම ශ්‍රී ලාංකේය

සමාජය සහ දේශපාලනය තුළ බුදුදහමේ ඇති වැදගත්කම පිළිබඳ ජනප්‍රිය හැඟීම්වලට ආයාචනා කළේය (Kearney 1976).

1956 මහ මැතිවරණය පිටුපස ඇති බලවේග අධ්‍යයනය කළ විද්වතුන් හෙළි කළේ ආගම සහ භාෂාව පදනම් කරගත් භික්ෂු සංවිධානවල භූමිකාව මැතිවරණයේ අවසාන ප්‍රතිඵලය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් බවයි (Phadnis 1976, Wriggins 1960, Vittaci 1958). එහි ප්‍රතිඵලයක් වශයෙන්, සංස්කෘතික අමාත්‍යාංශයක් ඇති කිරීම වැනි පියවර මගින් රාජ්‍යය බුද්ධාගමට අනුග්‍රහය දැක්වීමට පටන් ගත්තේය. අනතුරුව එළඹී කාල පරිච්ඡේදය තුළ බලයට පැමිණි ආණ්ඩු බුදුදහම සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග භික්ෂූන්ගේ අමන්දානන්දනයට හේතු විය. ඒ අනුව පළමු හා දෙවන ජනරජ ව්‍යවස්ථා යටතේ බුද්ධාගමට නිල පිළිගැනීමක් ලබාදීමෙන් ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම ආගමික රාජ්‍යයක් බවට පත් නොකළත්, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලැබෙන ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම සංඝයාගේ අතිමහත් සොම්නසට හේතුවක් විය (Wilson, 1974: 68).

ශ්‍රී ලාංකේය භික්ෂුව සහ දේශපාලනය පිළිබඳ තවත් සමහර විද්වතුන් අවධානය යොමු කළේ නැගී එන සීමාන්තික සිංහල-බෞද්ධ ජාතිකවාදී අදහස් මගින් භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කටයුතු කෙරෙහි සිදුකල බලපෑම කෙරෙහි ය (Kumar 2018, Dewasiri 2016, DeVotta 2007, Abeysekera 2001) සමකාලීන ශ්‍රී ලාංකේය බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි සිංහල ජාතිකවාදී මතවාදයේ දැඩි බලපෑම් එල්ල වී ඇත (Frydenlund 2005, Senevirathne 1999, Tambiah 1992, Mitchel 1979). භික්ෂූන් වහන්සේලාගේ මෙන්ම ගිහි පැවිද්දන් ගේ ද අනුග්‍රහය ලැබූ මෙම

මතවාදයට අනුව සිංහලයාගේ පැරණි ශ්‍රී විභූතිය යළි ඇති කිරීම භික්ෂුවගේ ප්‍රමුඛ කාර්යයක් විය. එමගින් ප්‍රකාශිත යථාර්තයක් වූයේ, සිංහල ජාතිය යනු , සරල බවින් අනූන හා බෞද්ධ සදාචාරයට අනුකූලව ජීවත් වූ ජනතාවක්ය යන්නයි.

පශ්චාත් සිවිල් යුධ සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ සාමය ගොඩනැගීම හා සංහිඳියා ක්‍රියාවලිය බරපතල අභියෝගයක් බවට පත්ව තිබේ. බර්තොලමියුස් සහ සිල්වා යන අයගේ *The role of the Sangha in the Reconciliation* (සංහිඳියා ක්‍රියාවලියේ භික්ෂුවගේ කාර්යභාරය) (2001) නමැති අධ්‍යයනය මගින් සාමය ගොඩනැගීම හා සංහිඳියා ක්‍රියාවලිය තුළ සංඝයා වහන්සේලාගේ කාර්යභාරය සාකච්ඡා කරයි. මෙම අධ්‍යයනය මගින් කතුවරුන් ඉදිරිපත් කළ ප්‍රධාන තර්කය වන්නේ සිංහල හා දෙමළ ජනයා අතර දිර්ඝකාලින සාමයකට මගපාදන බලය බෙදාගැනීමේ ක්‍රියාවලියට භික්ෂූන් එරෙහි වීමට බොහෝ දුරට වගකිව යුත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලබන අධ්‍යාපනය බවයි (Bertholomeusz & Silva 2001: 1). භික්ෂූ අධ්‍යාපන ක්‍රමයේ යෝග්‍ය වෙනස්කම් ඇතිකිරීමෙන් ශ්‍රී ලංකාවේ සංඝයා වහන්සේ දෙමළ සහ මුස්ලිම් ඇතුළු අනෙකුත් ප්‍රජාවන් කෙරෙහි වඩාත් සහනදායි ආකල්පයක් අනුගමනය කරනු ඇතැයි ඔවුහු විශ්වාස කරති. මේ පිළිබඳ අවධානය යොමු කළ ඇතැම් විද්වතුන් පවසන්නේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේදී භික්ෂූ අධ්‍යාපනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු බවත් දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයන් එහි විෂය මාලාවට ඇතුලත් කළ යුතු බවත්ය (Uyangoda 2007).

ශ්‍රී ලාංකේය බුද්ධාගමේ තුන්වන සහස්‍රකය භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන ඉතිහාසයේ වඩාත් අවේගකාරී අවධියක් සනිටුහන් කළේය. මෙහිදී සංඝ සමාජයෙන් කොටසක් සෘජුවම

දේශපාලනයට සම්බන්ධවීමත්, තවත් කොටසක් වක්‍රාකාරයෙන් දේශපාලනයට බලපෑම් කිරීමත් හඳුනාගත හැකිය. මෙම කාරණය පිළබඳව අධ්‍යයන ගණනාවක් කෙරී ඇත (Dewasiri 2016, DeVotta 2007, Uyangoda 2007). ඒ අනුව සංඝයාගේ දේශපාලන ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් බවට පත්වෙමින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා මැතිවරණ දේශපාලනය හරහා (2001 සහ 2004 පාර්ලිමේන්තු මැතිවරණ) පාර්ලිමේන්තු දේශපාලනයට පිවිසුණු අතර, සමහරෙක් ශ්‍රී ලංකාවේ වාර්ගික හා ආගමික ගැටුම් වලට දායක වෙමින්, ප්‍රචණ්ඩකාරීව හැසිරෙමින්, ප්‍රධාන ධාරාවේ දේශපාලන බලවේගවල අතකොලු බවට පත් විය (Deegalle 2006: 233-234).

ඉහතින් සාකච්ඡා කරන ලද සාහිත්‍ය විමර්ශනයේ සෙනවිරත්න ගේ The Work of Kings: The New Buddhism in Sri Lanka හෙවත් රජවරුන්ගේ කාර්යය: ශ්‍රී ලංකාවෙහි නව බුදුසමය නම් කෘතිය සමකාලීන ශ්‍රී ලාංකේය භික්ෂු දේශපාලනය අධ්‍යයනය කිරීමට සහ මෙම අධ්‍යයනයට අදාළව භික්ෂුවගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමට විශාල දායකත්වයක් ලබා දුන්නේය. සිය කෘතියෙන් සෙනවිරත්න අපේක්ෂා කළේ ශ්‍රී ලංකාවේ නව බුදුසමය වෙතින් ඉවසීම, අවිහිංසාව, සහ බහුත්වවාදය, වැනි විශ්ව සාධාරණ ගුණාංගවලින් හෙබි ලෞකික සමාජයක් ඇති කිරීම සඳහා කැප වූ සංඝ සමාජයක් බිහි කිරීමට අපොහොසත් වුයේ ඇයි ද යන්න සාකච්ඡා කිරීමයි. එබැවින් පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය විශ්ලේෂණය කිරීමේදී සෙනවිරත්න ගේ කෘතිය මෙම අධ්‍යයනයට බොහෝ සේ උපකාරී වූ බව කිව යුතුය.

මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනයේ දක්වන ලද ප්‍රකාශිත සාහිත්‍ය මගින් විවිධ විද්වතුන් විසින් භික්ෂූන්ගේ සමාජ සහ දේශපාලන භූමිකාවේ විවිධ පැතිකඩයන් විශ්ලේෂණය කර තිබේ. ඒ අනුව ඔවුන් රාජ්‍ය - භික්ෂු සබඳතාවල ස්වභාවය; භික්ෂු සමාජය අතර පවත්නා බෙදීම සහ ඒවායේ දේශපාලන හා සමාජීය ප්‍රතිවිපාක; භික්ෂුවගේ නව දේශපාලන භූමිකාව; පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලනයේ ස්වභාවය; ජනවාර්ගික-ජාතිකවාදය මගින් භික්ෂු දේශපාලනයට සිදුකල බලපෑම; පශ්චාත් සිවිල් යුධ සමයේ ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම හා සංහිඳියා ක්‍රියාවලිය සහ ශ්‍රී ලාංකේය බුද්ධාගමේ තුන්වන සහස්‍රකය තුළ භික්ෂූන්ගේ දේශපාලන කටයුතු යනාදී තේමාවන් සාකච්ඡා කර තිබේ. මේ අධ්‍යයනය මගින් භික්ෂු දේශපාලනය සම්බන්ධයෙන් මෙතෙක් අධ්‍යයනය නොකළ තේමාවක් සාකච්ඡා කරන්නට යෙදුනි. මෙහිදී අධ්‍යයනයට බඳුන් වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම් වූ භික්ෂූන් වහන්සේලා පශ්චාත් සිවිල් යුධ අවධියේ සිදුකළ සමාජ හා දේශපාලන කාර්යභාරය පිළිබඳවයි. මෙහිදී මින්පෙර කිසිදු පර්යේෂණයකින් සාකච්ඡාවට බඳුන් නොවූ ධාරාවන් දෙකක් ඉස්මතු විය. පළමුවැන්න වන්නේ පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ කේන්ද්‍රීය ප්‍රපංචයක් බවට පත්ව තිබු රාජපක්ෂ සාධකය මගින් භික්ෂු දේශපාලනයට සිදුකළ බලපෑම ඇගයීමට ලක් කිරීමයි. දෙවැන්න මගින් අපේක්ෂා කරන්නේ පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන කාර්යභාරය විශ්ලේෂණය කිරීමයි. එබැවින් මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම අපේක්ෂිතය.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය තේරුම් ගැනීමය. එම භික්ෂූන්ගේ කාර්යභාරය අධ්‍යයනය කිරීම තුළින් තේරුම් ගැනීමට අපේක්ෂා කරන්නේ, භික්ෂූන් තමන්ගේ කාර්යභාරය ලෙස සලකන්නේ කුමක්ද යන්න ඇගයීමය. මේ සදහා පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් වල ප්‍රතිවිපාක විශ්ලේෂණය කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදී බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව පිළිබඳව විශ්ලේෂණය කරනු ලැබේ. මෙම අධ්‍යයනය ගුණාත්මක ක්‍රමවේදය මත පදනම් විය. අධ්‍යයනය සඳහා තොරතුරු ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රවලින් ලබා ගන්නා ලදී. බස්නාහිර පළාතේ තෝරාගත් විශ්ව විද්‍යාල කිහිපයක ත්‍රිවිධ නිකායන් නියෝජනය වන පරිදි තෝරාගත් අධ්‍යයන සහ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු සමග සිංහල-බෞද්ධ ජාතිකවාදය, සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන කාර්යභාරය සහ රාජපක්ෂ රෙජීමය සංඝ සමාජයට කළ බලපෑම යන ක්ෂේත්‍ර ඔස්සේ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. එමගින් සිංහල බෞද්ධ මතවාදය පිළිබඳව ඔවුන් තුළ ඇති විවිධ කතිකාවන් තේරුම් ගැනීමට උත්සාහයක් ගන්නා ලදී. මෙයට අමතරව බස්නාහිර පළාතේ තෝරාගත් බෞද්ධ උගතුන් කිහිප දෙනෙකු සමග පර්යේෂණයේ තේමාවට අදාළව පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ මගින් දත්ත රැස් කරන ලදී.අධ්‍යයනය සදහා යොදා ගත් ද්විතියික මූලාශ්‍ර වන්නේ බුදුදහම පිළිබද ලියවී ඇති

ග්‍රන්ථ, සගරා ලිපි, පුවත්පත් ලිපි, සහ අන්තර් ජාලයෙන් ලබාගත් විවිධ මූලාශ්‍ර යනාදියයි. මෙලෙස එකතු කරන ලද තොරතුරු සාහිත්‍ය සමීක්ෂණයේදී රැස් කරන ලද පුළුල් පරාසයක ලේඛන සමඟ විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත.

**සාකච්ඡාව**

පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදය මත පදනම්ව කටයුතු කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දේශපාලන හා සමාජ භූමිකාව තුළින් ප්‍රතිදානය වන අනුභූතික සොයාගැනීම් පිළිබඳව මෙහිදී විශ්ලේෂණයක් සිදු කරයි. ඒ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගේ දේශපාලන හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණයේදී හඳුනාගත් ප්‍රතිපල කිහිපයක් මෙහිදී සාකච්ඡා කරනු ලැබේ. එනම් සිංහල- බෞද්ධ ජාතිකවාදය සහ සංඝ සමාජය, ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය, සහ රාජපක්ෂ රෙජීමය මගින් සංඝ සමාජයට සිදු කල බලපෑම පිළිබඳව මෙහිදී අවධානය යොමු කළේය.

**සිංහල- බෞද්ධ ජාතිකවාදය සහ සංඝ සමාජය**

රටක ජීවත්වන සෑම ජන වර්ගයකටම ඔවුන්ගේ ඓතිහාසික වර්ධනය සහ සංස්කෘතිය මත හැඩගැසුනු මතවාදයක් තිබේ. එක් එක් ජන වර්ගවලට සිය පැවැත්ම සඳහා එබඳු මතවාදයක් අත්‍යාවශ්‍ය වේ. මේ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය මගින් ප්‍රකාශ වන්නේ කුමක්ද යන්න සහ එය ස්වකීය මතවාදය බවට පත්කර ගත් සංඝ සමාජය හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ එක් පරමාර්ථයකි. ශ්‍රී ලංකාවේ වාසය කරන ජනයා වර්ගිකත්වයෙන්, භාෂාවෙන්, සහ ආගමෙන් විවිධ වෙති. ඉතිහාසය මුළුල්ලේම, රටේ බහුතරය වන සිංහල-බෞද්ධ කණ්ඩායම් විසින් අසිංහල, අබෞද්ධ යනුවෙන් හඳුන්වනු ලබන සුළුතරය හිංසනයට හා පීඩනයට භාජනය කර තිබේ. මේ අයුරින්

සිංහල බෞද්ධ බහුතරය විසින් ශ්‍රී ලංකාවේ ජීවත් වන සුළුතර කණ්ඩායම් වලට එරෙහිව ක්‍රියාත්මක කරන ලද හිංසනයට හා පීඩනයට දෘෂ්ටිමය පදනම සපයනු ලබන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය මගිනි. කෙසේවෙතත් සිංහල-බෞද්ධ ජාතිකවාදය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සමබන්ධයෙන් විද්වතුන් අතර පොදු එකගතාවයක් නොමැත.

බොහෝ ශාස්ත්‍රීය අධ්‍යයන මගින් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ අර්ථය, ඓතිහාසික විකාශනය හා මෑතකාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරීමට කටයුතු කර ඇත (Scott 1994, Gombrich & Obeysekera 1988, Malaloda 1976). ගොම්බ්‍රිජ් හා ඔබේසේකර ට අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදය යනු සිංහල සංස්කෘතිය පසුබිම් කොට ගොඩනැගූ බුදුදහමයි (Gombrich & Obeysekera 1988). ඔවුහු තවදුරටත් අවධාරණය කරන්නේ ථේරවාද බුදුදහම කෘෂිකාර්මික පදනමක් සහිත ලංකාවේ ග්‍රාමීය සමාජයට අනුකලනය වීමෙන් සිංහල-බෞද්ධ ජාතිකවාදය බිහි වූ බවයි. කෙසේවෙතත් ඔවුන්ගේ මතය වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදය යන්න එකිනෙකට වෙනස් ස්ථර ලෙස නොව ඒකීය ආගමික සම්ප්‍රදායක් ලෙස තේරුම් ගත යුතු බවයි. මේ අනුව ථේරවාදී බුදුදහමේ මුලික ඉගැන්වීම්, ග්‍රාමීය සිංහලයන්ගේ විශ්වාස හා මිත්‍යාමත වල සංකලනයෙන් සිංහල සංස්කෘතිය සහ වාර්ගිකත්වය කෙරෙහි අවධානය යොමු කරන ශ්‍රී ලාංකීය දේශපාලන දෘෂ්ටිවාදයක් ලෙස සිංහල-බෞද්ධ ජාතිකවාදය තේරුම් ගත හැකිය.

1970 ගණන්වල සුළුතර වාර්ගික ප්‍රජාවන්ට එරෙහිව කෙරුණු ප්‍රචාරක කටයුතු වල ප්‍රතිපලයක් වශයෙන් සිංහල-බෞද්ධ

ජාතිකවාදයේ ඇතිවූ වර්ධනයන් සම්බන්ධයෙන් කුමාරි ජයවර්ධන අදහස් දැක්වුයේ මෙසේය;

"සිංහල ජනවර්ගය ලංකාවේ පළමු ප්‍රථමික වැසියෝ වෙති. මේ ලක්බිමේ පූර්ණ අයිතිය ඔවුන් සතුය. කලාපිය වශයෙන් ගත් කළ සිංහල ජනතාව සුළුතරයකි. ඔවුන්ට ලංකාව හැරෙන්නට වෙන රටක් නැත. ලංකාවේ වාසය කරන අනිකුත් ජනවර්ගයන්ට වෙනත් රටවල්, ජනවාර්ගික සම්බන්ධතා හා අවශ්‍යතාවන් ඇත. සිංහලයන් හා බුද්ධාගම අතර විශේෂ සම්බන්ධතාවයක් ඇත. සිංහලයෝ බෞද්ධාගමේ ආරක්ෂකයෝය" (ජයවර්ධන, 2000: 63-64).

මේ අනුව සිංහල-බෞද්ධ ජාතිකවාදයට පදනම්වූ ප්‍රධාන අදහස් කිහිපයකි. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන්ම බෞද්ධ රටකි. එහි අයිතිය ඇත්තේ සිංහල-බෞද්ධයන්ට පමණි. අනෙක් සිංහල-බෞද්ධ නොවන අය සිංහල-බෞද්ධයන්ගේ මෙම තනි අයිතිය පිළිගන්නා තාක් කල් කිසිදු ගැටලුවකින් තොරව මෙහි ජීවත් වීමට අවසර ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ගෙන් බහුතරය සිංහලයන් වන බැවින්, ඔවුන්ගෙන් බහුතරයකගේ ආගම බුදු දහම වන නිසා සිංහල-බෞද්ධ දෘෂ්ටිය රටේ ජාතික මතවාදය විය යුතුය යන්න මේ මතවාදයේ හරය වේ.

ඩි. වොට්ටා ට (DeVotta) අනුව සිංහල බෞද්ධ ජාතිකවාදය යනුවෙන් හැඳින්වෙන්නේ ඒකීය ශ්‍රී ලංකා රාජ්‍යය තුළ සිංහල බෞද්ධ ආධිපත්‍යය පුළුල් කිරීමට සහ චිරස්ථායී කිරීමට යොදාගත් ජාතිකවාදී මතවාදයකි (DeVotta 2007). ඔහු තවදුරටත් තර්ක කරන්නේ සිංහල බෞද්ධ ආධිපත්‍යය ආයතනගත කිරීම සඳහා නීති, රීති, ආයතනික ව්‍යුහයන් නිර්මාණය කිරීම සහ මෙම මතවාදයට එකඟ නොවන අය රාජ්‍යයේ සතුරන් ලෙස සලකා ප්‍රහාර එල්ල කිරීමද සිදු වූ බවයි.

එමෙන්ම, ශ්‍රී ලංකාව යනු ථේරවාදී බුද්ධාගමේ කේන්ද්‍රස්ථානය බවත් එය සිංහල බෞද්ධයන්ට අයිති බවත්, දෙමළ සහ වෙනත් අය එහි ජීවත් විය යුත්තේ සිංහල බෞද්ධ ආධිපත්‍ය පිළිගෙන දෙවැනි පංතියේ පුරවැසියන් ලෙස බවත් එම මතවාදයෙන් ප්‍රකාශ වේ. එපමණක් ද නොව දහනවවැනි සියවසේ අගභාගයේ සහ විසිවන සියවසේ වාසය කළ භික්ෂූන් සහ දේශපාලනඥයන් විසින් ඉදිරිපත් කරන ලද සිංහල බෞද්ධ මිථ්‍යා-ඉතිහාසය ද එහි සංවර්ධනයට බොහෝ සේ බලපා ඇත.

සිංහල-බෞද්ධ ජාතිකවාදය පිළිබඳ විග්‍රහයක යෙදෙන සෙනවිරත්නයන් (2001), එමගින් සංඝ සමාජයට ඇති කෙරෙන බලපෑම කුමක්දැයි විස්තර කළේය. ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන සිංහල-බෞද්ධ ජාතිකවාදය මගින් සංඝ සමාජය වෙත ඇති කරන ලද බලපෑම තල දෙකකින් විස්තර කළ හැකිය (සෙනවිරත්න, 2001). එනම් පළමුව බෞද්ධ රාජ්‍ය ගොඩනැගීමේ ක්‍රියාවලිය හෙවත් රාජ්‍ය, රාජ්‍යත්වය සහ මහජනයා බුද්ධාගම සමග අනන්‍යවීමේ ක්‍රියාවලිය තුළ භික්ෂුව ඉටුකරන කාර්යභාරයයි. දෙවනුව බෞද්ධ ආශ්‍රමය තුළ භික්ෂුව ඉටුකරන අධ්‍යාපන හා සංස්කෘතික කාර්යභාරයයි. මේ අනුව බෞද්ධ භික්ෂුව සාර්ව වශයෙන් බෞද්ධ රාජ්‍යය ගොඩනැගීමේ ක්‍රියාවලිය තුළත්, ක්ෂුද්‍ර වශයෙන් බෞද්ධ ආශ්‍රමය ඇසුරින් මහජනතාවගේ දෛනික ජීවිතය තුළට සමාජීය හා සංස්කෘතික වශයෙන් බලපෑම් කරනු ලබයි.

ඉහතින් සඳහන් කළ විග්‍රහයන්ට අනුව සිංහල බෞද්ධ ජාතිකවාදය හැඳින්විය හැක්කේ වාර්ගික ආගමික ස්වභාවයක් ගන්නා, සිංහල භාෂාව මෙන්ම බුද්ධාගම ද උකහා ගන්නා ජාතිකවාදයක් ලෙස ය. එහි අතිමූලික සූත්‍රගත කිරීම වන්නේ ශ්‍රී ලංකාව වනාහි සිංහල-බෞද්ධයන්ට පමණක් අයත් යැයි අවධාරණය කිරීමය. සිංහල-බෞද්ධ

ජාතිකවාදය අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් විද්වතුන් අතර විසම්මුතිකභාවයක් පැවතියත් සියලු දෙනා එමගින් ප්‍රකාශිත සිංහල-බෞද්ධ අනන්‍යතාවය සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය අතර වෙනසක් නොපවතින වාය  යන අදහසට එකග වෙති. එසේම ඔවුන් අවධාරණය කරන්නේ, වෙනත් ආගමික හා වාර්ගික කණ්ඩායම්වලට රට තුළ වාසය කළ හැක්කේ, ඔවුන් බුද්ධාගමේ උත්තරීතරභාවය සහ සිංහල භාෂාවේ සහ සංස්කෘතියේ ප්‍රමුඛත්වය පිළිගන්නා තාක් කල් පමණක් බවයි.

කෙසේ වෙතත් සිංහල ප්‍රජාව තුළ සිය අනන්‍යතාවය තහවුරු කිරීම සහ අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සිංහල ජනතාව සංවිධානය කිරීම මගින් සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය යටත්විජිත යුගයේ ප්‍රගතිශීලි කාර්යභාරයක්  ඉටු කළේය. එහෙත් නිදහසින් පසු අවධියේ එය  ශ්‍රී ලංකික මතවාදයක් බවට පත්නොවී සිංහල බහුතරයේ මතවාදය බවට පත්විය. එනිසාම එය සුළුතර ජනවාර්ගික හා ආගමික කොටස් කෙරෙහි අනර්ථකාරී බලපෑම් ඇති කරන එමගින් ඔවුන්ගේ පැවැත්ම ප්‍රශ්න කරන එකක් බවට පත්වී තිබේ. මේ පසුබිම තුළ පශ්චාත් සිවිල් යුද්ධ සමයේ භික්ෂූන්ගේ කාර්යභාරය අවබෝධ කර ගැනීම සදහා සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදය යටත්විජිත යුගයේ සිට වර්තමානය දක්වා විකාශය වූ ආකාරය සාකච්ඡා කළ යුතුය.

සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ ප්‍රභවය සිදුවූයේ යටත් විජිත ශ්‍රී ලංකාවේ දේශීය ධනේශ්වර පංතියේ දේශපාලන ව්‍යාපෘතියක් ලෙසය (ජයවර්ධන 2000, උයන්ගොඩ 2000, ගුණසිංහ 2000). ආරම්භයේදී එය බෞද්ධ නොවන ආගමික විරෝධී ව්‍යාපාරයක් ලෙසත්, පසුකාලයේදී එය සුළුතර ජන වර්ග විරෝධී ව්‍යාපාරයක් ලෙසත් ගොඩනැගිණි (ජයවර්ධන 2000). මුල් අවස්ථාවේදී ඔවුන් තුළ පැවතියේ ක්‍රිස්තියානි විරෝධී නැඹුරුවකි. යටත් විජිත පාලනය විසින්

ක්‍රිස්තියානි ආගමිකයන්ට ලබා දී තිබූ වරප්‍රසාද සිංහල-බෞද්ධ මාධ්‍යම පංතිය නොරිස්සුහ. මේ පසුබිම තුළ ඔවුන් ක්‍රිස්තියානි විරෝධී ව්‍යාපාරයක් දියත් කළ අතර මේ කටයුත්ත සඳහා ලංකාව වූකලී ධර්මද්වීපයකි යන මතවාදය උපයොගී කරගත්හ (Scott 1994). එසේම ඔවුහු ක්‍රිස්තියානි මිෂනාරීන්ගේ ආගමික ප්‍රචාරණයට සහ ඔවුන්ගේ අධ්‍යාපනික ආයතන පිහිටුවීමේ ක්‍රියාවලියට එරෙහි වෙමින් පානදුරාවාදයට පනදෙමින්, බෞද්ධ අධ්‍යාපනික ආයතන පිහිටවීමට කටයුතු කළේය. අනගාරික ධර්මපාල වැනි බෞද්ධ නායකයන් මෙහි මුලිකත්වය ගත් අතර විසිවන සියවසේ මුල් අවධිය වන විට එය පුළුල් බහුජන ව්‍යාපාරයක් බවට පත්වී තිබුණි.

ආරම්භයේදී සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ මූලික ලක්ෂණයක් වූයේ වෙළඳ තරගයයි (ජයවර්ධන 2000). 1915 මුස්ලිම් විරෝධී අරගලයෙන් එය මනාව පිලිබිඹු වේ. විසිවන සියවසේ ආරම්භය වන විට ලංකාවේ වෙළද ආධිපත්‍ය සිංහල නොවන පිරිස් සතුව පැවතීම මෙයට හේතුව විය. විසිවැනි සියවස ආරම්භය වන විට මෙරට වෙළද අධිපත්‍යය විදේශිකයන් සතුව තිබුණි (ජයවර්ධන 2000). එහෙත් මේ අවධිය වන විට නැගී එන වෙළඳ පංතියක් බවට පත්ව සිටි සිංහල වෙළඳුන්ගේ කෝපය විශේෂයෙන්ම එල්ලවී තිබුනේ මුස්ලිම් ව්‍යාපාරිකයන් වෙතටය. අනගාරික ධර්මපාල, පියදාස සිරිසේන වැනි සිංහල-බෞද්ධ පුනර්ජීවනවාදීන්ගේ අදහස් මේ සඳහා විශාල බලපෑමක් කර තිබේ. අවසානයේදී සිංහල-බෞද්ධ ව්‍යාපාරිකයන් ප්‍රමුඛ අන්තවාදී පිරිස් මුස්ලිම් ජනයාට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙමින් මුස්ලිම් ව්‍යාපාරික ස්ථාන වනසා දැමීමට කටයුතු කළේය. 1915 සිංහල-මුස්ලිම් කොලාහලය යනුවෙන් හැඳින්වුණු මෙය ආගමික හේතු මත

සාධාරණීකරණය කළත් එහි සැඟවුණු අර්ථය වෙළඳ තරගය විය (නවරත්න බණ්ඩාර 2001).

සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ශ්‍රී ලංකික දෙමළ ජනයාට ද එරෙහි විය (Wriggins 1960). පළමුවෙන් ඔවුන් දෙමළ ජනයාට එරෙහිව හැඟීම් උත්සන්න කළේ භාෂා ප්‍රශ්නය පදනම් කරගෙනය. නිදහස් අධ්‍යාපනයෙන් ඉහළට ගිය සිංහල උගත්තු දෙමළ විරෝධී උද්ඝෝෂණයේ පෙරමුණේ සිටි අතර, මුලදී ද්වි භාෂා ප්‍රතිපත්තියක් වෙනුවෙන් පෙනී සිටි සිංහල දේශපාලඥයන්ද පසු කාලයේදී එයට එක් විය (De Silva 2008). 1950 දශකය ආරම්භයේ සිට භාෂා ප්‍රශ්නය ජනවර්ග දෙක අතර ගැටුම්කාරී තත්වය උත්සන්න කිරීමට හේතුවක් වූ අතර පසු කාලයේ භාෂා ප්‍රශ්නය ද ඇතුළු තවත් ප්‍රශ්න රාශියක බලපෑමෙන් ජන වර්ග දෙකේම ජීවිත දහස් ගණනක් බිලිගත් බිහිසුණු සිවිල් යුද්ධයක් දක්වා එය විකාශනය විය. එහෙත් සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු රටේ දිර්ඝකාලීන සාමයකට, සංහිඳියාවකට මගපාදන සම්මුතියක් ගොඩනැගුනේ නැත. සිදුවුනේ ජනවර්ග හා ආගමික කණ්ඩායම් තවදුරටත් ධ්‍රැවීකරණය කරමින් අවසානයේ ඔවුන් අතර විභේදනය තීව්‍ර කිරීමයි. පශ්චාත් සිවිල් යුද්ධ ශ්‍රී ලංකාවේ රාජපක්ෂ රෙජීමයේ පාලනය යටතේ සිදුවී ඇත්තේ මෙයයි.

ඉහතින් විස්තර කරන ලද යටත්විජිත යුගයේ ප්‍රභවය ලබා වර්ධනය වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිය පශ්චාත් සිවිල් යුද්ධ සමයේ භික්ෂූන්ගේ මග පෙන්නන්නා බවට පත්විය. එතැන් සිට වර්තමානය දක්වා භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් හැඩගස්වන කේන්ද්‍රීය සාධකය වුයේ සිංහල-බෞද්ධ ජාතිකවාදයයි. ක්‍රි.පු තුන්වන සියවසේ මෙරටට ථේරවාද බුදුදහම හදුන්වා දීමෙන්

අනතුරුව එය ආරක්ෂා කොට පවත්වා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ සංඝයා වහන්සේලාටය. එතැන් ඔවුන් රාජ්‍ය අනුග්‍රහය ඇතුව මේ කටයුත්තෙහි නිරත විය. මෙලෙස බුදුදහමේ භාරකරුවන් බවට පත්වූ සංඝ සමාජයට එදා සිට අද දක්වාම රාජ්‍ය විසින් අනේකවිධ උදව්- උපකාර ලබා දී ඇත. එදා සිටි රජවරුන් සෑම ගමක් ගානේ සඟ ආශ්‍රම පද්ධතියක් ගොඩනගන ලදී. ඉදින් මෙහිදී අප සිංහල-බෞද්ධ ජාතිකවාදයේ ප්‍රභවය සිදුවූ යටත්විජිත සමයේ සිට පශ්චාත් සිවිල් යුද්ධ සමය තෙක් එකී මතවාදය පෝෂණය කළ සංඝ සමාජය හඳුනාගත යුතුය.

නූතන ශ්‍රී ලංකාවෙහි භික්ෂූන් කෙරෙහි අතිමහත් බලපෑමක් සිදුකළ බෞද්ධ නූතනවාදයේ පියා ලෙස සලකනු ලබන්නේ අනගාරික ධර්මපාල ය (Senevirathne 1999). සෙනවිරත්න සිය අධ්‍යයනයේදී ධර්මපාල බෞද්ධ නූතනවාදයේ පියා ලෙස අර්ථකථනය කළා පමණක් නොව බෞද්ධ භික්ෂුව රැක බලාගන්නා සහ සමාජ සේවකයා ලෙස ද නිර්වචනය කළේය (Senevirathne 1999: 27). ධර්මපාල විසින් භික්ෂූන් වෙතින් ප්‍රයෝගික සහ මතවාදී වශයෙන් අංශ දෙකක කාර්යභාරයක් අපේක්ෂා කළේය (අමුණුගම 1985). පළමුවැන්නෙන් අදහස් කළේ ජනතාවගේ ජීවන මට්ටම නංවාලීම සහ ඔවුන්ගේ ජීවිතයේ ගුණාත්මක අංශය වර්ධනය කිරීමයි. දෙවැන්නෙන් අදහස් කරන ලද්දේ පැරණි ලංකාවේ අනාදිමත් කාලයක් තිස්සේ පැවති සිංහල සංස්කෘතිය නැවත ගොඩනැගීමයි. මෙහිදී පළමු කාර්යය ඉටු කිරීම සඳහා 1873 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් විද්‍යෝදය පිරිවෙන පිහිටුවිය. දෙවැන්න ඉටු කිරීම සඳහා 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලදී. පූර්ව නිදහස් අවධියේ

සිට මේ පිරිවෙන් දෙක ආශ්‍රිත භික්ෂු කණ්ඩායම් ස්වකීය කාර්යභාරය සපුරා ගැනීම සඳහා කැප වූහ.

විද්‍යෝදය පිරිවෙන ආශ්‍රිත භික්ෂු කණ්ඩායමේ භික්ෂූන් වහන්සේලා අනගාරික ධර්මපාල විසින් තමන් වෙත ආරෝපණය කරන ලද මතවාදී කරුණු ප්‍රයෝගික කරුණු වලින් වෙන් කර ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය උදෙසා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් හඳුන්වා දුන්හ (Senevirathne 1999: 127). විද්‍යෝදය පිරිවෙන ආශ්‍රිත භික්ෂු කණ්ඩායමේ වඩාත් ක්‍රියාකාරී ලෙස ග්‍රාමීය ප්‍රදේශවල සමාජ සේවා කටයුතු වල යෙදුනු භික්ෂූන්ට නිදසුන් වන්නේ කලුකොඳයාවේ පඤ්ඤාසේකර, හීනටියන ධම්මාලෝක, හා හෙන්ඩියගල සීලරතන යන නා හිමිවරුන්ය. උන්වහන්සේලා මහණකම පිළිබඳ සම්ප්‍රදායික අදහස් දරූ කණ්ඩායමක් විය. මෙම භික්ෂූන් වහන්සේලා ධර්මපාල අනුව යමින් හැකිතාක් දුරට අල්පේච්ඡ ජීවන චර්යාවක් අනුගමනය කිරීමට උත්සාහ කළහ. එසේම මෙම භික්ෂූන් වඩාත් ප්‍රයෝගික වූ ජාතිකවාදී මතවාදයක් නියෝජනය කළ බැවින් උන්වහන්සේලා පටු ජාතිවාදයෙන් තොර ජාතිමාමක පිරිසක් වූහ. එහෙත් අවසාන විග්‍රහයේදී මෙම භික්ෂූන්ට අර්ථවත් ක්‍රියාකාරී සමාජ-දේශපාලන ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා අවශ්‍ය වූ දර්ශනයක් මෙන්ම සුදුසුකම් ද නොවිය (Senevirathne 1999: 127-128).

විද්‍යාලංකාර පිරිවෙන නියෝජනය කළ භික්ෂූන්, 1940 ගණන්වල ආරම්භයේ සිට ක්‍රියාකාරී විය. ඔවුන්

ඉක්මනින් සමාජ-දේශපාලනික කටයුතු වලට නැඹුරු වූහ. විද්‍යාලංකාර පිරිවෙන ආශ්‍රිතව ක්‍රියාකාරීවූ භික්ෂූන් වහන්සේලා නම් ලුණුපොකුණේ ධම්මානන්ද, හැඩිපන්නල පඤ්ඤාලෝක, කොටහේනේ පඤ්ඤාකිත්ති, යක්කඩුවේ ප්‍රඥාරාම, වල්පොල රාහුල සහ බඹරැන්දේ සිරි සීවලී යන

හිමිවරුන් ය (උයන්ගොඩ 2020). මේ භික්ෂූන් එලිපිටම දේශපාලනයේ නිරතවීම නිසා විද්‍යෝදය භික්ෂූන්ගෙන් වෙනස් විය. විද්‍යාලංකාර මතවාදය ඔවුන්ගේ දේශපාලන මතවාදය බවට පත්විය. විද්‍යාලංකාර මතවාදයේ අත්පොත ලෙස හඳුන්වනු ලැබූ 'භික්ෂුවගේ උරුමය' වල්පොල රාහුල හිමියන් විසින් ලියනු ලැබිය. මේ කෘතිය පළකළේ භික්ෂූන් වහන්සේලා දේශපාලනයේ යෙදීම සුදුසුද නැතහොත් කැපද යනුවෙන් විවාදයක් තිබූ අවධියකය. එහදී විද්‍යාලංකාර භික්ෂූහු, භික්ෂූන් වහන්සේලා දේශපාලනයේ යෙදීම සුදුසුය යන මතවාදය වෙනුවෙන් පෙනී සිටියේය. 1940 දශකය ආරම්භයේ සිට විද්‍යාලංකාර භික්ෂූන් වාමාංශික පක්ෂ හා වෘත්තීය සමිති ව්‍යාපාරය සමග සම්බන්ධ වෙමින් රැඩිකල් දේශපාලන කටයුතු වල නිරත විය. ඔවුන්ට මගපෙන්වූ දේශපාලන මතවාදය වුයේ මාක්ස්වාදයයි.

මෙලෙස නිදහසට පෙර අවධියේ ධර්මපාල ගේ මතවාදී දර්ශනය අනුව සමාජ හා දේශපාලන කටයුතුවල නිරතව සිටි භික්ෂූන් 1950 දශකයේ මැද භාගයේ සිට අධිපතිවාදී සිංහල-බෞද්ධ ජාතිකවාදයේ මගපෙන්වන්නන් බවට පත්වී සමාජ හා දේශපාලන කටයුතුවල නිරත වූ ආකාරය හඳුනාගත හැකිය (ප්‍රඥාරාම, 1970). ආරම්භයේදී මෙම භික්ෂූන් ප්‍රකාශ කළේ 1948 දී ලැබුන නිදහස අසම්පූර්ණ බවත්, සිංහල-බෞද්ධ ජාතියේ නැති වූ අභිමානය එනයින් ප්‍රතිස්ථාපනය නොවූ බවයි (උයන්ගොඩ 2000). මේ වනවිට සිංහල ප්‍රභූ දේශපාලන පැලැන්තියේ දේශපාලන සටන් පාඨය බවට පත්ව තිබූ පූර්ණ දේශපාලන නිදහස දිනා ගැනීමේ ව්‍යාපාරය සඳහා මෙම භික්ෂු කණ්ඩායම අනගි සහායක් ලබා දෙන ලදී. එහෙත් මේ කණ්ඩායම විසින් දේශපාලන නිදහස සම්පූර්ණ කර ගැනීමේ ක්‍රියාදාමය ඉදිරිපත් කරන ලද්දේ ආගමික-දේශපාලන අර්ථයෙනි. ඔවුන්ගේ ඒකායන අරමුණ වුයේ සිංහල-බෞද්ධ

ප්‍රභූන්ට දේශපාලන බලය ලබා ගැනීමට උදව් කිරීමයි. අවසානයේදී ඔවුන් දීප ව්‍යාප්ත ලෙස සංවිධානය වෙමින්, 1956 මැතිවරණයේ දී මහජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණය සඳහා උර දුන්හ.

මේ අයුරින් නිදහසින් පසු අවදියේ සිට වර්ධනය වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී මතවාදයේ පෙරගමන්කරුවා වුයේ සංඝ සමාජයයි. ඔවුන්ගේ බලපෑමෙන් පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාව වේගයෙන් සිංහල-බෞද්ධ රාජ්‍ය ව්‍යාපෘතියකට අවතීර්ණ විය. එහිදී ඔවුන් බහුතර ප්‍රජාවේ ආගමත්, භාෂාවත් ප්‍රමුඛස්ථානයට පත් කිරීම සඳහා දේශපාලන පක්ෂ ගෙනගිය වැඩපිළිවෙලේ යුහසුළුව කටයුතු කරන ලදී. ඔවුන්ගේ වේගවත් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකා රාජ්‍යයේ හැඩරුව ලෙස හඳුනාගත හැකි වුයේ සිංහල-බෞද්ධ වාර්ගික ආධිපත්‍යධාරී ක්‍රමයකි. එය සැකසුනේ වාර්ගික ධුරාවලිය තුළ සිංහල ප්‍රජාව උත්තරීතර ස්ථානයක වැජඹෙන අයුරිනි.

**ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය**

ශ්‍රී ලංකා සමාජය තුළ වාසය කරන ප්‍රධාන ජන වර්ගය වන සිංහල බහුතරය අදහන ආගම් අතුරින් බුද්ධාගම ප්‍රධාන හෙයින් එය රටේ බහුතරයේ ආගම ලෙස හැඳින්විය හැකිය. බුද්ධාගම යන්න රටේ බහුතරයේ ආගම බවට පත්ව ඇත්තේ එය මෙරටට හඳුන්වා දුන් ක්‍රි.පු.තුන්වන සියවසේ සිටය (ලියනගමගේ 2010; 1993). එතැන් සිට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ඇතුව ලංකාවේ රාජ්‍ය ආගම බවට පත්වූ බුද්ධාගම බටහිර බලවතුන්ගේ අණසකට පත්වන තෙක් කිසිදු උපද්‍රවයකින් තොරව පැවතිණි. පහළොස්වන සියවසේ සිට ඇරඹි බටහිර පාලනය තුළදී අනෙක විධ බාධා මධ්‍යයේ වුවද එහි කේන්ද්‍රීය බව නොනැසී පැවතුනි. කෙසේ වෙතත් බටහිර බලවතුන්ගෙන් නිදහස

දිනා ගැනීමෙන් අනතුරුව නැවතත් විසිවැනි සියවසේ අගභාගයේ සිට එය පූර්ණ අනුග්‍රහය ලබන රාජ්‍ය ආගම බවට පත්විය. ශ්‍රී ලංකා සමාජය තුළ බුද්ධාගම ආරක්ෂා කොට එය වසර පන් දහසක කාලයක් නොනැසී ආරක්ෂා කොට පවත්වා ගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ සංඝයා වහන්සේලාටය. එබැවින් තත්කාලීන සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව විමසා බැලීමද මෙම අධ්‍යයනයේ තවත් පරමාර්ථයකි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ භික්ෂූන් දේශපාලන කාර්යභාරයක් ඉටු කරනු ලැබුවේය යන්න පොදුවේ පිළිගත් මතයකි (Deegalle 2006, Senevirathne 1999, Tambiah 1992, Gombrich & Obeysekera 1988).

එසේම ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ ප්‍රත්‍යක්ෂ වන කරුණක් නම් භික්ෂූන් සහ රාජ්‍ය අතර ස්ථාවර සම්බන්ධතාවයක් පැවති බවත් එම සම්බන්ධතාවය හරහා සිංහල ජාතික අනන්‍යතාවයක් ගොඩනැගුනු බවයි

(Gombrich & Obeysekera 1988). ලියනගමගේ සංඝයා වහන්සේලා සහ රාජ්‍ය අතර ගොඩනැගුණු සම්බන්ධතාවය දෙපක්ෂයටම අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වූ ආකාරය මෙසේ නිරීක්ෂණය කළේය.

"නව ආගම පිහිටුවීමත් සමග ආරම්භ වූ රාජ්‍යය හා සංඝයා අතර සම්බන්ධතාවය, ඉන් පසුව එළඹී සියවස්වලදී අඛණ්ඩව වර්ධනය විය. යථෝක්ත ද්විපාර්ශවිය සම්බන්ධය දෙපක්ෂයටම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් විය. දේවානම්පිය තිස්ස රජතුමා සංඝයාට ඉඩකඩම් පූජා කළේය. විහාරස්ථාන හා දාගැබ් ඉදි කරවිය. එසේ කරන ලද්දේ දානමාන හා සෙසු පිරිකර සැපයීමට අමතරවය. මේ ප්‍රතිපත්තිය

ඔහුගේ අනුප්‍රප්තිකයෝ ද මහත් උද්යෝගයකින් අනුගමනය කළහ" (ලියනගමගේ 2010: 119-120).

සිංහල රජවරුන්ගේ ත්‍යාගශීලි අනුග්‍රහය ලැබූ භික්ෂූන්, ස්වකිය හොද හිත හා ආශිර්වාදය නිරතුරුවම රජවරුන් කෙරෙහි යොමු කළ අතර, එහි ප්‍රතිපල වශයෙන් මහජනයාගේ පක්ෂපාතිත්වය රාජ්‍යය වෙත නැඹුරු වීමට අනුබලයක් ලැබිණි. මේ අනුව ජනතාව සහ බුදු දහම අතර ගොඩනැගෙන අත්‍යන්ත බැදීමත්, එමගින් ආගම සහ ජාතික අනන්‍යතාවය නොබිදිය හැකි අයුරින් පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් සංඝයා වහන්සේලා දැඩි බලපෑමක් සිදු කළ බව ප්‍රකාශ කිරීම අනුචිත නොවෙයි.

මේ අයුරින් සිංහල රජවරුන්ගේ නොමද අනුග්‍රහය ලැබූ භික්ෂූන් ස්වකීය කාර්යභාරය බටහිර ජාතින් මෙරටට පැමිණෙන තෙක් ඉතා කලාතුරකින් හටගත් දුෂ්කරතා හා ගැටුම් හැරුණු විට බාධාවකින් තොරව, නිරවුල්ව ඉදිරියට පවත්වා ගෙන ගියේය. එකල භික්ෂූන් ස්වකීය කාර්යභාරය පවත්වා ගෙන ගියේ ගම කේන්ද්‍ර කර ගෙනය. මේ නිසා භික්ෂුව/ගම යන පුරුක යටත්විජිත යුගය තෙක් ගම්දනව් පුරා දක්නට ලැබුණි. කෙසේ වෙතත් යටත්විජිත යුගයේ තත්වය මුළුමනින්ම වෙනස් විය. එයට හේතුව යටත්විජිත සමයේ සුපිරි භික්ෂු සමාජයක් ගොඩනැගීමයි. සම්ප්‍රදායික භික්ෂු භූමිකාව වන විමුක්ති මාර්ග ගවේෂණය අතැර දැමු මේ භික්ෂු කණ්ඩායම වාණිජවාදයේ සරණ ගිය ජනවාර්ගික ජාතිකවාදය ස්වකීය මතවාදය බවට පත් කර ගත් පිරිසක් විය. මොවුන් ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන ප්‍රතිසංස්කරණ විරෝධී, ගතානුගතික දේශපාලන හා සමාජ බලවේග බවට පත්වී ඒ අනුව ස්වකීය කාර්යභාරය සකසා ගත් කණ්ඩායමක් විය. වර්තමානයේදී මෙම භික්ෂු කණ්ඩායම නියෝජනය කරන්නේ සමාජ හා දේශපාලන

කටයුතු ඉටු නොකරන ප්‍රමාණාත්මක වශයෙන් කුඩා කණ්ඩායමක් වන වනවාසී භික්ෂූන් හැරුණුකොට විහාරස්ථානවල වැඩ වසන සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන්ගෙන් අති-බහුතරයයි. මේ භික්ෂූන්ගෙන් බොහෝ දෙනෙකු පැවිදි දිවියට එළඹී ඇත්තේ සිය කැමැත්තෙන් නොවේ. දෙමව්පියන්ගේ බලපෑම නිසාය. ගැමි සමාජයේ පහල ස්ථරයෙන් පැමිණෙන මේ භික්ෂූන්ගෙන් බහුතරය උසස් අධ්‍යාපනය ලබා පශ්චාත් උපාධි පවා ලබා ගත් පිරිසකි.

මේ අනුව වර්තමානයේදී  මෙම භික්ෂු ප්‍රජාව සම්භාව්‍ය බුද්ධාගමේ දක්නට ලැබෙන විමුක්ති මාර්ගය උදෙසා කැපවෙමින් කටයුතු කිරීම වෙනුවට සිංහල-බෞද්ධ ජාතිකවාදය සිය පරමාදර්ශ බවට පත්කර ගනිමින් එය ව්‍යාප්ත කරන පිරිසක් බවට පත්ව සිටිති. ශ්‍රී ලංකා සමාජය තුළ භික්ෂූන් වහන්සේ හඳුන්වනු ලබන්නේ 'ජාතියේ මුර දේවතාවුන්' හැටියටය. සිංහල ජාතිය අනතුරකට මුහුණ දෙන ඕනෑම අවස්ථාවකදී ජාතිය බේරාගැනීම සඳහා සංඝයා වහන්සේ ඉදිරියට පැමිණෙන අන්දම ගැන විවිධ මිත්‍යා කථා ජනමාධ්‍ය ඔස්සේ නිරතුරුවම ප්‍රචාරය කරති. එහෙත් මෙහිදී සත්‍ය වශයෙන්ම සිදුවී ඇත්තේ භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය සම්බන්ධයෙන් ජනතාව අතර තිබෙන පිළිගැනීම යටපත් කරමින් ජනමාධ්‍ය යොදා ගනිමින් ඔවුන්ගේ ප්‍රතිරූප ඉහළ නැංවීම සඳහා දියත් කරන ව්‍යාපෘති හේතුවෙන් අනවශ්‍ය වැදගත්කමක් සංඝයා වහන්සේලාට ලබා දීමයි.

සිංහල-බෞද්ධ ජාතිකවාදය පිළිගත් භික්ෂූන්ගේ කාර්යභාරය වූයේ සමාජ සේවයයි. එහෙත් ඔවුන්ගේ සමාජ සේවා කටයුතු ඉලක්ක කරන ලද්දේ දේශපාලනය ඇතුළු ගිහි සමාජ සේවා කටයුතුවල යෙදීමයි. මොවුන් පැවිදි ජීවිතය තුළ පැවතිය යුතු පරමාදර්ශ හුදෙක් වචනයට පමණක් සීමා කළ පිරිසක් විය. ඉදින්, මෙහිදී අප හඳුනා ගන්නේ තමා වටා වාඩිවී එකත්පස්ව සිටින පිරිසකට කිසියම්

තේමාවකට ධර්මය දේශනා කරන සංඝයා වහන්සේලා නොව රූපවාහිනී හෝ ගුවන් විදුලියේ පෙනී සිටිමින් ජනතාව අමතන හෝ පුවත්පත් ඔස්සේ නිවේදන නිකුත් කරන භික්ෂූන්ය. බොහෝ දුරට යම් යම් බලලෝභී දේශපාලන කණ්ඩායම් ජනතාව තුළ ඇතිවන සාමූහික අනාරක්ෂාව පිළිබඳ හැඟීම් ප්‍රයෝජනයට ගනිමින් සිදු කරන ප්‍රචාරක ව්‍යාපෘතියක කොටස් කරුවන් බවට පත්ව ඇත්තේ මෙකී භික්ෂූන් ය.

පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකා සමාජ-දේශපාලන ක්‍රමයේ දියත් වූ සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘති නිසා භික්ෂු සමාජය තදබල වෙනස්කම්වලට භාජනය වී ඇත. විශේෂයෙන්ම 2019 ජනාධිපතිවරණ අවස්ථාව වන විට උච්චස්ථානයක පැවති සිංහල-බෞද්ධ ජාතිකවාදී ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව සිටියේ මෙකී භික්ෂූන් ය. කෙසේවෙතත් ගෝඨාභය රාජපක්ෂ පාලනය අනුගමනය කරන ලද අදූරදර්ශී ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්තිවල බලපෑමෙන් ආණ්ඩුව බිදවැටුණි. එහි ප්‍රතිපල වශයෙන් එතෙක් අතිමහත් සමාජ හා දේශපාලන පිළිගැනීමක් හිමි කරගෙන සිටි සංඝයා වහන්සේලාගේ සමාජ හා දේශපාලන කාර්යභාරය අනුක්‍රමයෙන් ගරා වැටෙන්නට විය. මේ අනුව 2022 දී රාජපක්ෂ පාලනය බිද දැමීමට දියත් කළ අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් සම්ප්‍රදායික බලාධිකාර ධූරාවලියේ සාමාජිකයෙකු වන භික්ෂුවගේ සමාජ තත්වය පමණක් නොව කාර්යභාරය ද පහළ වැටෙන්නට විය. සියලු බලාධිකාර ව්‍යුහ පිරිහීමට පත්වෙමින් තිබෙන පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ සම්ප්‍රදායික බලාධිකාර ව්‍යුහයේ මූලික පාර්ශවකරුවෙකු වන සංඝයා වහන්සේලාගේ කාර්යභාරය ඒ හැටියෙන්ම ජනතාව පිළිගන්නවාද යන්න වඩාත් විවාද සම්පන්න තේමාවක් බවට පත්ව තිබේ.

**රාජපක්ෂ රෙජීමය සහ සංඝ සමාජය**

දේශපාලන විද්‍යාව තුළ රෙජීමය නැත්නම් පාලන තන්ත්‍රය (Regime) යන්න විවාද සම්පන්න යෙදුමකි (විතානවසම්, 2019; උයන්ගොඩ, 2018). ඇතැම් අය එය ආණ්ඩුව යනුවෙන් හඳුන්වනු ලැබුවත්, එයට ඇත්තේ වෙනස් අර්ථයකි. මේ අනුව ආණ්ඩුවක්, එහි මතවාද, සමාජ පදනම සහ නායකත්වය පදනම් කරගෙන හැඳින්වීම සඳහා රෙජිම යන්න භාවිත කරනු ලැබේ. මේ පදනම මත ආණ්ඩුවේ නායකත්වය හොබවනු ලබන පුද්ගලයාගේ නමින් රෙජීමය යන්න හඳුන්වනු ලබන අතර එයට ලබා දිය හැකි නිදසුනක් වන්නේ රාජපක්ෂ රෙජීමය යන්නයි. මෙහිදී අපගේ පර්යේෂණය සිදුකළ කාලය තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩු බලය හොබවන ලද්දේ රාජපක්ෂ පවුලේ සාමාජිකයන් වූ බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුව හැඳින්වීම සඳහා රාජපක්ෂ රෙජීමය යන්න භාවිත කරන ලදී. මේ අධ්‍යයනයට පසුබිම් වූයේ රාජපක්ෂ රෙජීමයේ පාලන සමය (2010-2015 සහ 2019-2022) වන බැවින්, එම පාලනය සමය තුළ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව හැඩගැසුණු ආකාරය විමසා බැලීම ද මෙම අධ්‍යයනයේ තවත් පරමාර්ථයකි.

සිංහල-බෞද්ධ ජාතිකවාදයේ දේශපාලන පදනම බොහෝ දුරට සිංහලවාදී දේශපාලන පක්ෂ නතු කර ගෙන සිටින පසුබිමක, එයට නායකත්වය දෙනු ලබන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානය (පසු කාලයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලෙස හඳුන්වන ) විසින් නායකත්වය දෙන ලද පාලන තන්ත්‍රයයි. රාජපක්ෂ රෙජීමයේ පාලනය ශ්‍රී ලංකාවේ සුළුතර ජනවර්ගවලට මෙන්ම ආගමික කණ්ඩායම් වලටද අභියෝගාත්මක කාල පරිච්ඡේදයකි. රාජපක්ෂ පාලනය යටතේ හඳුන්වා දුන් බොහෝ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් සුළුතර වාර්ගික සහ ආගමික කණ්ඩායම් සමකාලින දේශපාලන ක්‍රමය තුළ බරපතල වෙනස්කම් කිරීම් වලට ලක් කෙරිණි.

එල්.ටී.ටී.ඊ. සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීමෙන් අනතුරුව මුස්ලිම්වරුන් ද සිංහල-බෞද්ධ ජාතිකවාදයේ වෛරය සහ ප්‍රචණ්ඩත්වයේ ගොදුරු බවට පත් විය. මේ අනුව රාජපක්ෂ රෙජීමයේ සිංහල-බෞද්ධ ජාතිකවාදී ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් පවත්වා ගෙන ගිය රාජ්‍ය පාලනයේ ප්‍රධාන මතවාදී හවුල්කරුවා බවට පත්ව සිටියේ බෞද්ධ භික්ෂූන් ය. මෙහිදී රාජපක්ෂ පාලනයේ අනුග්‍රහය ලබමින් සමාජ හා දේශපාලන කටයුතු වල නිරත වූ භික්ෂූන් වහන්සේලා කවුරුන්දැයි හඳුනාගැනීම පශ්චාත්-සිවිල් යුද්ධ අවධියේ භික්ෂු භූමිකාව සම්බන්ධයෙන් ඵලදායි සාකච්ඡාවකට මග හෙළි කිරිමකි.

භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන මතවාද ඉතා සංකීර්ණ සහ විසම්මුතික ස්වභාවයකින් යුක්ත වේ. උයන්ගොඩ (2018) පශ්චාත් සිවිල් යුධ කාලය තුළ සංඝයා අතර පැවති දේශපාලන ප්‍රවණතා පදනම් කරගෙන සංඝ සමාජය ප්‍රභේද කිහිපයකට බෙදා දැක්විය.

1. රාජ්‍ය සමග අනන්‍යවන භික්ෂූන්,

2. දේශපාලන පක්ෂවලට සම්බන්ධ භික්ෂූන්,

3. ප්‍රගතිශීලි භික්ෂූන් සහ

4. දේශපාලනය ගැන උනන්දුවක් නොදක්වන භික්ෂූන් (උයන්ගොඩ 2018).

මෙම භික්ෂු කණ්ඩායම් අතුරින් මෙම අධ්‍යයනයේදී පරීක්ෂාවට ලක් කළේ පළමු ස්තරයයි. ප්‍රමාණයෙන් කුඩා වුවත් සමාජ හා දේශපාලන වශයෙන් වඩාත් බලපෑම් සහගත කණ්ඩායම වන්නේ මේ

පිරිසයි. ඔවුන් ශ්‍රී ලංකික සංඝ සමාජය තුළ බලගතු කණ්ඩායම වී ඇත්තේ ආණ්ඩුවේ දේශපාලනඥයන්, ජනමාධ්‍ය හිමිකරුවන් සහ ගිහි ධනවතුන් සමග තිබෙන කිට්ටු සම්බන්ධතාවය නිසාය. මොවුන් රටේ සමාජ හා දේශපාලන ප්‍රශ්නවලට විශේෂයෙන්ම සුළුතර වාර්ගික හා ආගමික කණ්ඩායම්වල ගැටළු සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා ප්‍රතිසංස්කරණ යන තේමාවලදී මතවාදීමය වශයෙන් පමණක් නොව දේශපාලනික වශයෙන් ද මැදිහත් වූ ආකාරය හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේදී මෙකී භික්ෂූන්ගේ කාර්යභාරය  දේශපාලනික හා සමාජීය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා සාකච්ඡා කරනු ලැබේ.

පළමුවෙන් මෙම භික්ෂූන්ගේ දේශපාලන කාර්යභාරය සාකච්ඡා කිරීමේදී, පශ්චාත් සිවිල් යුධ සමයේ මෙම භික්ෂු කණ්ඩායම සිදුකරන ලද මැදිහත්වීමේ දේශපාලන පැතිකඩ කෙරෙහි අවධානය යොමු වේ. සමහර දේශපාලන විචාරකයන් මේ භික්ෂු කණ්ඩායම රාජපක්ෂ රෙජීමයේ දේශපාලන ව්‍යාපෘතියක නියමුවන් හැටියට හඳුනාගෙන තිබේ (Uyangoda 2007). එම භික්ෂූන්ගෙන් සමහරෙක් මහින්ද රාජපක්ෂගේ දේශපාලන වැඩසටහන් තුළ ද, තවත් සමහරෙක් ගෝඨාභය රාජපක්ෂ සමගද එක්ව කටයුතු කරන ලදී. මේ අනුව ඔවුන් 2015 දී යහපාලන ආණ්ඩුව ඉදිරිපත් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයට එරෙහිව මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම සමග එක්ව ප්‍රබල විරෝධයක් දැක්විය (De Votta 2021). එසේම  ගෝඨාභය රාජපක්ෂ  ආණ්ඩුව ඉදිරිපත් කළ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට දැඩි ලෙසින් පක්ෂපාතී විය. මේ අනුව රාජපක්ෂවරුන් ස්වකීය දේශපාලන අභිලාෂයන් වෙනුවෙන් මෙම භික්ෂූන් දේශපාලන වශයෙන් උසිගන්වනු ලැබූ බව ඉතා පැහැදිලිය.

දේශපාලනිකව ස්වකිය අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා පශ්චාත් සිවිල් යුධ සමය තුළ, මහජන ජීවිතයට ආක්‍රමණශීලී ලෙස මැදිහත් වූ භික්ෂු දේශපාලන සංවිධාන රාශියක ක්‍රියාකාරීත්වය හඳුනාගත හැකිය. එබඳු භික්ෂු සංවිධාන අතරින් වඩාත් සාකච්ඡාවට භාජනය වන්නේ බොදු බල සේනා, සිහල රාවය සහ රාවණා බලය යන සංවිධානයි. මෙම සංවිධාන තුනේ නායකත්වය දරන්නේ අනුපිළිවෙලින් ගලගොඩඅත්තේ ඥානසාර, ඉත්තෑකන්දේ සද්ධාතිස්ස, සහ අක්මීමන දයාරතන යන භික්ෂූන්ය. මොවුන් මෑතකාලීනව බුදුදහම දේශපාලනීකරණය කිරීමේදී ක්‍රියාකාරී චරිත බවට පත්වූ තරුණ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙති. එපමණක් නොව තරුණ බෞද්ධ භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් ස්වකිය දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහභාගී කරවා ගැනීමට මෙම සංවිධාන සමත් වී තිබේ. ජනප්‍රියත්වයෙන් අඩු එහෙත් ඉහතින් සඳහන් සංවිධාන වලට සමාන එවැනි තවත් බෞද්ධ සංවිධාන කිහිපයක් තිබේ. එබඳු සංවිධානයකට නිදසුනක් ලෙස 'සිංහ-ලේ' නමින් හඳුන්වන කණ්ඩායම සඳහන් කළ හැකිය.

රාජපක්ෂ රෙජීමයේ මුල් අදියරේදී එනම් සිව්වැනි ඊළාම් යුද්ධයට පෙර කාලයේ මෙම භික්ෂූන් ජනවාර්ගික ගැටුම සාකච්ඡා මගින් විසඳීමේ ප්‍රවේශය, විදේශ මැදිහත්වීම් සහ රාජ්‍ය නොවන සංවිධාන (NGO) සම්බන්ධයෙන් බරපතල විරෝධයක් දැක්විය (Dewasiri 2016, DeVotta 2007). එහිදී ඔවුන්ගේ නිර්දය විවේචනයට ලක් වුයේ ජනවාර්ගික ගැටුම විසඳීම සඳහා වූ සාකච්ඡාමය ප්‍රවේශයයි. එසේම නෝර්වේ රාජ්‍යයේ සත්කාරකත්වයෙන් එල්ටීටීඊය සමග පැවැත්වූ සාම සාකච්ඡා ක්‍රියාවලිය විවේචනය කරමින් හැකි පමණින් එය කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයක ද නිරත විය (Uyangoda 2007). සටන් විරාම

ගිවිසුම බිඳවටිමෙන් අනතුරුව එල්.ටි.ටි.ඊ. සංවිධානයට එරෙහිව පවත්වා ගෙන ගිය සිව්වැනි ඊලාම් යුද්ධයේ මතවාදී හවුල්කරුවන් ලෙස කටයුතු කළේ ද සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් ය. එපමණකද නොව ඔවුන් රාජපක්ෂ රෙජීමය එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කිරීමේ යුධ ප්‍රයත්නයට කොන්දේසි විරහිතව සහාය දක්වමින්, එයට එරෙහිව කටයුතු කළ සියල්ලෝම ත්‍රස්තවාදීන්ගේ සහායකයින් සහ දේශද්‍රෝහීන් ලෙස සලකා හංවඩු ගසමින් සමාජයෙන් කොන් කිරීමේ ව්‍යාපාරයක් දියත් කළහ (Dewasiri 2016, DeVotta 2008). මේ අයුරින් ගැටුම් සාමකාමී ලෙස විසදා ගැනීම සම්බන්ධයෙන් බුදුදහමේ ඉදිරිපත් වී ඇති ප්‍රවේශයට එරෙහි වීම පශ්චාත් සිවිල් යුද්ධ සමයේ සිංහල බෞද්ධ ජාතිකවාදී භික්ෂු මතවාදයේ පැතිකඩකි.

පශ්චාත් සිවිල් යුධ සමය තුළ මෙම භික්ෂු කණ්ඩායම් රාජපක්ෂ රෙජීමයේ පූර්ණ අනුබලය සහිතව ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ආගමික විරෝධයක් පවත්වා ගෙන ගිය අතර එහි ප්‍රතිඵල වශයෙන් සුළුතර ආගමික කණ්ඩායම්වල ආගමික ඇදහිලි, වත්-පිළිවෙත් හා චර්යාවන් කෙරෙහි තදබල විරෝධයක් සමාජය තුළ ජනිත කළේය. මේ අනුව ඔවුන් පළමුවෙන් ක්‍රිස්තියානි ආගමික කණ්ඩායම්වල ප්‍රචාරණ කටයුතු වලටද, දෙවනුව මුස්ලිම්වරුන්ගේ ආගමික චර්යාවන් හා සංස්කෘතිය කෙරෙහි ද ප්‍රචණ්ඩත්වය පදනම් කරගත් විරෝධයක් පළකළහ. මෙහිදී ඔවුන් මුස්ලිම්වරුන්ට එරෙහිව ක්‍රියාත්මක කළ විරෝධය කෙළවර වුයේ ආගමික ගැටුම් මාලවකිනි. මේ කටයුත්තේදී බොදු බල සේනා, රාවණා බලය සහ සිහල රාවය යන භික්ෂු සංවිධාන සෘජුව මැදිහත් වූ අතර ජාතික හෙළ උරුමය, ජාතික නිදහස් පෙරමුණ, සහ පිවිතුරු හෙළ උරුමය, වැනි සමහර සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලන පක්ෂ තිරය පිටුපස සිටිමින් එම ක්‍රියාවන් සාධාරණීකරණය කළහ.

මෙම භික්ෂු කණ්ඩායම නියෝජනය කළ ඇතැම් භික්ෂූන් රටේ නීතියට සහ අධිකරණයට අභියෝග කරමින් ප්‍රචණ්ඩකාරීව හැසිරුණ ආකාරය හඳුනාගත හැකිය (උයන්ගොඩ 2018). පශ්චාත් සිවිල් යුද්ධ සමයේ මෙබඳු චර්යාවක් ප්‍රකට කළ භික්ෂූන් අතර ඉදිරියෙන්ම සිටියේ ගලබොඩඅත්තේ ඥානසාර භික්ෂුවයි. එම භික්ෂුව හැසිරුණු ආකාරයෙන් පැහැදිලි වන්නේ රටේ නීතියට, අධිකරණයට හා ව්‍යවස්ථාවට ඉහළින් සිටින පාර-පුරවැසි කණ්ඩායමක් (Supra-citizens) ලෙස පෙනීසිටීමට ඔවුන් තුළ වූ අභිලාෂයයි. භික්ෂූන් රටේ නිතිය කඩ කළ අවස්ථාවකදී ඔවුන්ට එරෙහිව නිතිය ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයට අයිතියක් නැතැයි යන මතය සමාජගත කිරීම එමගින් අපේක්ෂිත ය. මෙය එක අතකින් රාජ්‍යයේ පරමාධිපත්‍ය බලය ඉක්මවා ගිය සුපිරි බලයක් සංඝයාට ඇතැයි යන්න ප්‍රකාශයට පත්කිරීමක් වන අතර තවත් අතකින් සිංහල බෞද්ධ රාජ්‍යයක් ගොඩනැගීමට තිබෙන අභිලාශය පෙන්නුම් කිරීමක් වේ. මේ පසුබිම තුළ 2019 පැවති ජනාධිපතිවරණයේදී පොදුජන පෙරමුණේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂට සහාය දෙමින් ඔවුන් උත්සාහ කළේ ශ්‍රී ලංකා රාජ්‍යය සිංහල-බෞද්ධ රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමය (උයන්ගොඩ 2018).

එපමණක් නොව, මෙකී භික්ෂූන් බොහෝ අවස්ථාවලදී රාජපක්ෂ රෙජීමයේ ප්‍රචාරකයින් ලෙසින් ඉටු කළ කාර්යභාරය අතිමහත් ය. 2009 මැයි මාසයේදී මහින්ද රාජපක්ෂගේ දේශපාලන නායකත්වය යටතේ එල්.ටී.ටී.ඊ සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් පසු අත්කර ගත් දිගුකාලීන යුද ජයග්‍රහණයේ ප්‍රීතිය සිංහල-බෞද්ධ සමාජය මහත් අභිමානයෙන් යුක්තව සැමරීම සඳහා වූ ප්‍රචාරක ව්‍යාපෘතිය සඳහා ඔවුහු අපමණ අයුරින් දායක විය. එසේම යුද්ධයේ

අවසන් අදියරේදී සිදු වූ යුද අපරාධ සම්බන්ධයෙන් රාජපක්ෂ රෙජීමයට චෝදනා එල්ල කළ බටහිර බලවතුන් සහ මානව හිමිකම් කවුන්සලය කෙරෙහි ජනතා විරෝධයක් ජනිත කරවීමද ඔවුන්ගේ සැගවුණු න්‍යාය පත්‍රයේ කොටසක් විය. පසු කාලයේ රාජපක්ෂ පවුලේ සාමාජිකයින් වෙත එල්ල වූ දූෂණ හා අපරාධ චෝදනා සම්බන්ධයෙන් මේ භික්ෂුහු ඔවුන්ගේ නිර්දෝෂීභාවය වෙනුවෙන් කරුණු දැක්විය. එමගින් රෙජීමයට එරෙහිව එල්ලවූ  චෝදනා වල බැරෑරුම් භාවය කිසියම් දුරකට සමනය කෙරිණි. මේ සාධක සියල්ලම රාජපක්ෂ රෙජීමයේ වාසියට හේතු වූ අතර පසු කාලයේ පවත්වන ලද මැතිවරණ වලින් ඉහළ ජනවරමක් රාජපක්ෂ පාලනයට ලැබී ඇත්තේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මෙම ආක්‍රමණශීලි භික්ෂු කණ්ඩායමේ ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල වශයෙන් සිංහල-බෞද්ධ දෘෂ්ටිය අන්තවාදී ආගමික මතවාදයක් බවට පත්වූ ආකාරය හදුනාගත හැකිය. ආණ්ඩුවෙන් ලැබුණු දේශපාලන රැකවරණය නිසා ඔවුන් පොදු ස්ථානවල පවා  ප්‍රචණ්ඩකාරී හැසිරීම් ප්‍රදර්ශනය කළේය. කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් නිසා පොලිසිය ඉදිරියේ පවා ඔවුන් නීතිය අමු අමුවේ උල්ලංඝනය කළහ. රාජපක්ෂ රෙජීමය ඔවුන්ට ලබාදුන් දණ්ඩමුක්තිය සුළුතර වාර්ගික හා ආගමික කණ්ඩායම් වලට එරෙහි ක්‍රියාකාරකම් තවදුරටත් දිරිමත් කළේය. මෙම භික්ෂූන්ගේ ශාසන විරෝධී ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නායක භික්ෂූන් වහන්සේලා නිහඩ පිළිවෙතක් අනුගමනය කිරීමද විශේෂත්වයකි.

මේ ආකාරයට පශ්චාත් සිවිල් යුධ අවධියේ රාජපක්ෂ රෙජීමයේ දේශපාලන උපායමාර්ග වලට අවශ්‍ය මතවාදී හවුල්කරුවන් ලෙස මෙම භික්ෂූන් ඉටුකළ කාර්යභාරය අතිමහත්ය. අවසානයේදී මේ

සියලු ක්‍රියාකාරකම් මගින් නිගමනය කළ හැක්කේ ඔවුන් දැඩි ලෙස දේශපාලනීකරණය වූ භික්ෂු කණ්ඩායමක් වන බවයි. ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් වෙතින් සිංහල-බෞද්ධ ජාතිකවාදය නව අවධියකට ප්‍රවේශ විය. එය සිංහල-බෞද්ධ ජාතිකවාදයේ ප්‍රචණ්ඩ ප්‍රකාශනය වේ. එබැවින් සිංහල-බෞද්ධ ජාතිකවාදයේ නව ප්‍රකාශකයා වූ මෙම භික්ෂු කණ්ඩායම සම්බන්ධයෙන් එළඹිය හැකි නිගමනය වන්නේ රාජපක්ෂ රෙජීමයේ සිංහල බෞද්ධ ජාතිකවාදය කේන්ද්‍ර කර ගත් පාලනයේ පංගුකරුවන් ලෙස ඔවුන් හඳුන්වනු ලැබීමය. ශ්‍රී ලංකික සමාජය තුළ ඔවුන් 'රාජපක්ෂ නිකාය' හා 'වොයිස් කට් භික්ෂූන්' යනුවෙන් හැඳින්විමෙන් එය සනාථ වී තිබේ.

මීළගට, අපගේ අවධානය යොමු වන්නේ සිංහල-බෞද්ධ ජාතිකවාදී භික්ෂූන් ඉටුකළ සමාජ සේවය පිළිබඳ ඇගයුම් කරන්නටය. මෙහි භික්ෂූන්ගේ සමාජ කාර්යභාරය සාකච්චා කිරීමේදී පළමුකොටම පැවසිය හැක්කේ වල්පොල රාහුල හිමියන් ස්වකීය 'භික්ෂුවගේ උරුමය' කෘතියෙන් ඉදිරිපත් කළ, භික්ෂුවගේ භූමිකාව විය යුත්තේ සමාජ සේවය සඳහාය යන අදහස අතිමහත් සංවාදයකට විවර කර ඇති බවය. විසිවන සියවසේ මැද භාගයේ දී වල්පොල රාහුල හිමියන් ස්වකීය 'භික්ෂුවගේ උරුමය' කෘතියෙන් ඉදිරිපත් කළ මූලික අදහස වන, භික්ෂුවගේ භූමිකාව විය යුත්තේ සමාජ සේවය සඳහාය යන අදහස සම්බන්ධයෙන් කතිකාවක් මේ වනවිට ශ්‍රී ලංකේය සමාජය තුළ ගොඩනැගී තිබේ (Wijeratne 1990). මේ පදනම යටතේ, වර්තමානයේදී කිරිබත්ගොඩ ඥානානන්ද, පිටිදූවේ සිරිධම්ම යන භික්ෂූන් විසින් පවත්වා ගෙන යන සමාජ සේවා කටයුතු බොහෝ දෙනාගේ සංවාදයට ලක් වී ඇත. මෙහිදී එළඹිය හැකි නිගමනය වන්නේ වර්තමාන භික්ෂූන් වහන්සේලා විවිධ

නම් වලින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ සේවා කටයුතු මගින් බුදුදහමේ මූලික පරමාර්ථ වලට හානි සිදුවන බවයි.

භික්ෂූන් වහන්සේලා සදහා යොදා ගත හැකි, සිංහල-බෞද්ධ ප්‍රජාවට පිළිගත හැකි අන්දමේ සාරධර්ම පද්ධතියක් අඩංගු නව සමාජ සේවයක් ගොඩනගා ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් විසි එක්වන සියවසේ ආරම්භය වන විට පැන නැගී තිබිණි (Swaris 2000). එය කිසියම් ප්‍රමාණයකට රාජපක්ෂ රෙජීමයේ සිංහල-බෞද්ධ අධිපතිවාදී දේශපාලන ව්‍යපෘති සදහා මග එළිපෙහෙළි කරන්නක් විය. මේ වන විටත් විවිධ සමාජ ක්‍රියාකාරකම්වල නියැලී සිටි භික්ෂූන් කිහිප දෙනෙක් මේ සදහා මූලිකත්වය ගෙන කටයුතු කළ අතර ඔවුන් ප්‍රථමයෙන් අවධානය යොමු කළේ දුගී -දුප්පත්කමේ පහළ සීමාව නියෝජනය කළ ග්‍රාමීය සිංහල ජනයා සවිබලගැන්වීම කෙරෙහිය (Akimoto 2020). මේ අරමුණ වෙනුවෙන් කැපවුණු භික්ෂූන් බොහෝදුරට මිල-මුදල් අතින් ස්ථාවර වූ අති-සුඛෝපභෝගී දිවි පෙවතක් ගත කරන, එබඳු පැවැත්මක් සංකේතවත් කරන අංගෝපාංග වලින් අනූන පිරිසක් විය. මොවුන්ගෙන් බොහෝ දෙනෙක් උපාධිධාරීන් වන අතර ධනය, ඉඩකඩම්, ගොවිපලවල්, ආපනශාලා, පුද්ගලික පංති, ගොඩනැගිලි බදුදීම් වැනි කුඩා පරිමාණ ව්‍යාපාර පවත්වා ගෙන යයි. ඔවුන් නිරතුරුවම විදේශ රටවල සංචාරය කරන අතර එහිදී එම රටවලට සංක්‍රමණය වූ බෞද්ධයන්ගේ ආධාරයෙන් දේශනා පැවැත්වීම ද සිදු කරයි.

භික්ෂුවගේ සැබෑ අභිප්‍රාය විය යුත්තේ සංසාරික පැවැත්ම හා සම්බන්ධ වූ අරමුණු මුදුන් පමුණුවා ගැනීමයි. භික්ෂුව එයින් බැහැර වූ විට සිදු වන්නේ මහණකමේ පදනම නැති වී යාමයි. එවිට භික්ෂූන්ට තමන් කැමති ඕනෑම දෙයක් කළ හැකි වේ. සමාජ සේවය නමැති කඩතුරාව මගින් වාණිජකරණයෙහි වාන් දොරටු අරිනු ලැබ ඇති මෙම

භික්ෂු කණ්ඩායම ප්‍රතිපත්තියට වඩා පර්යාප්තිය ඉහලට නංවන ලද ක්‍රියාකාරකම් වල නිරතව සිටි. මෙම තත්වය පිලිබඳව මානව විද්‍යාඥයන් තර්ක කරන්නේ පැවිදි ජීවිතයෙහි ශීලය පදනම් කරගත් අල්පේච්ඡ පරමාදර්ශය බැහැර කොට අභ්‍යන්තර පෙළඹවීමකින් තොර සමාජ සේවයෙහි නිරතවීමක් ලෙසය (Senevirathne, 1999; Tambiah, 1992; Spencer, 1990).

**නිගමනය**

මෙම අධ්‍යයනය මගින් පශ්චාත් සිවිල් යුද්ධ අවධියේ ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ජාතිකවාදී අදහස් දරනු ලැබූ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සමාජ හා දේශපාලන භූමිකාව විමර්ශනයට ලක් කළේය. වර්තමානයේදී භික්ෂූන්ගේ සමාජ හා දේශපාලන භූමිකාව හැඩ ගැසීම කෙරෙහි සිංහල-බෞද්ධ ජාතිකවාදය ඉතා විශාල බලපෑමක් කර ඇත. ලංකාවේ බුද්ධාගම රාජ්‍යයේ නිල ආගම බවට පත්වීමෙන් පසු භික්ෂූන් රාජ්‍යය තුළ අසහාය තත්වයකට පත්වීම සිදුවිය. ශ්‍රී ලංකාවේ ථේරවාද බෞද්ධ ඉතිහාසය මුළුල්ලේම සමාජ-දේශපාලන කාර්යයෙහි යෙදෙන භික්ෂූන් දක්නට ලැබුනත් ග්‍රාමීය සහ නාගරික වශයෙන් සමාජ-දේශපාලන කාර්යයෙහි යෙදෙන සුපිරි භික්ෂු කණ්ඩායමක ප්‍රභවය සිදු වන්නේ යටත්විජිත පාලනයේ වර්ධනයත් සමගය. පශ්චාත් නිදහස් යුගයේ බලයට පත් ආණ්ඩු අනුගමනය කළ ප්‍රතිපත්ති තවදුරටත් මෙම සුපිරි සංඝයාගේ සමාජ-දේශපාලන ක්‍රියාදාමයන් වේගවත් කළේය. පශ්චාත් සිවිල් යුධ සමයේ රාජපක්ෂ රෙජීමය යටතේ තීව්‍ර කළ සිංහල-බෞද්ධ ජාතිකවාදී ප්‍රතිපත්ති මගින් මෙම භික්ෂූන්ගේ සමාජ-දේශපාලන ක්‍රියාකාරකම් ඉහලම තලයට ඔසවා තිබුණි.

ඉතිහාසය පුරාම භික්ෂූන් සමාජ හා දේශපාලන කටයුතුවල යෙදී ඇති බවට සැකයක් නැත. එපමණක් නොව භික්ෂූන් එසේ කළ යුතු බවට සමහරුන් තර්ක ද කරති. විශේෂයෙන්ම, අපගේ

අධ්‍යයනයේදී සාකච්ඡා කළ පශ්චාත් සිවිල් යුධ සමයේ භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් මගින් බොහෝ දෙනෙකු අපේක්ෂා කළ ආකාරයේ සමාජ හා දේශපාලන කාර්යභාරයක් ඉටුවූයේ නැති බවත් ඒ වෙනුවට ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිංහල-බෞද්ධ ජාතිවාදී පක්ෂ වල අභිවෘද්ධියට හේතු වූ බව ඉතා පැහැදිලිය. එබැවින් මෙම පර්යේෂණයට අනුව නිගමනය කළ හැක්කේ එබඳු කටයුතු කිරීම හේතු කර ගෙන භික්ෂූන් කෙරෙහි ගිහියන් තුළ තිබෙන ගෞරවයට හානි සිදුවී ඇති බවයි. භික්ෂුවගේ කාර්යභාරය පිළිබඳ සැලකීමේදී ඔවුන් පැවිදි ජීවිතයෙහි ශිලය පදනම් කරගත් අල්පේච්ඡ පරමාදර්ශයන් ඉවත දමා සිංහල-බෞද්ධ ජාතිකවාදී දේශපාලන පක්ෂවල පෙළඹීම් සහිත සමාජ හා දේශපාලන කටයුතු වල නිරතවන බව අධ්‍යයනයෙන් අනාවරණය විය. සමාජීය හා දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී භික්ෂූන් වහන්සේලා අනෙකුත් සංඝ පාර්ශවවල මෙන්ම ගිහියන්ගේ ද දැඩි විවේචනයට ලක්ව ඇත. ඇත්ත වශයෙන්ම, දේශපාලන භික්ෂූන් වහන්සේලාට එල්ල වන පොදු විවේචනයක් නම්, ඔවුන්ට දේශපාලන භූමිකාවක් ඉටු කිරීමට අවශ්‍ය නිපුණතාවය නොමැතිවීමයි. නිදසුන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන හෝ ආර්ථික ප්‍රතිපත්ති ගැන හෝ ප්‍රමාණවත් දැනුමක් ඔවුන් තුළ නොපැවතීම සඳහන් කළ හැකිය. එපමණක් නොව, ගිහියන් විශාල වශයෙන් සංඝ භූමිකාව දෙස බලන්නේ ආගමික වශයෙන් මිස දේශපාලනික වශයෙන් නොවේ. එබැවින් භික්ෂූන් වහන්සේලා කළ යුත්තේ යුද්ධය, සමාජ සුබසාධනය, ගැටුම් නිරාකරණය වැනි ජාතික ප්‍රශ්නවලදී සක්‍රීය බලවේගයක් ලෙස පක්ෂ දේශපාලනයට ඉහළින් සිටිමින් ස්වකීය සමාජ හා දේශපාලන කාර්යභාරය ඉටු කිරීමයි.

භික්ෂූන් වහන්සේලා සතුව අතිමහත් බලයක් ඇතැයි ශ්‍රී ලාංකික දේශපාලඥයන් සහ සිංහල මැද පංතිය විශ්වාස කළත් එය සත්‍ය නොවන බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය. ඔවුන්ට එබඳු අසහාය

බලයක් නොමැති බවත්, හැකියාව ලැබී ඇත්තේ දේශපාලන බලවේග වල අතවැසියෙකු වීම පමණි. බලගතු පාලක ප්‍රභූ පැලැන්තියට අභියෝග කළ හැකි ඒකීය සමාජ පදනමක් සංඝ සමාජය තුළ ගොඩනැගී නැත. ඔවුන් නිකාය පදනමින් බෙදීගොස් ඇත. එසේනම් සංඝයා වහන්සේලා සතුව පවත්නා බලාධිකාරය කුමක්ද. මානව විද්‍යාඥයන් තර්ක කරන්නේ සංඝයා සතු බලධිකරයේ වපසරිය උත්සවාකාර සහ සංකේතමය තත්වයන්ට සීමාවන බවයි. කෙසේ වෙතත් ඔවුන්ට ශ්‍රී ලංකේය දේශපාලනය තුළ 1956 සහ 2019 මැතිවරණ වලදී ජන්දදායකයාට සැලකිය යුතු බලපෑමක් කරමින් සිංහල බෞද්ධ ජාතිකවාදී පක්ෂවල දේශපාලන ජයග්‍රහණ තහවුරු කිරීමට හැකියාව ලැබිණි. එහෙත් වර්තමානයේදී එසේ කළ හැකිද. මෙම භික්ෂු කණ්ඩායමට වර්තමානයේ කළ හැකිව ඇත්තේ ආණ්ඩු බලයට පත් කරනවා හෝ පෙරලා දමනවා යනුවෙන් යථාර්තවාදී නොවන වහසිබස් දෙඩවීම පමණි. හැරත් මොවුන් වනාහි සමස්ත භික්ෂු සමාජයම නියෝජනය කරන හෝ බලය පතුරුවාගෙන සිටින කණ්ඩායමක් නොවේ. රාජපක්ෂ රෙජීමයේ බලය උත්සන්නව පැවති සමයේ ඇතැම් ජනමාධ්‍යවල සහායෙන් කිසියම් බලයක් හිමි කරගෙන සිටියත් වර්තමානයේ තත්වය වෙනස් වෙමින් පවතී. මේ අනුව ඔවුන් වඩා හොදින් දේශපාලන බලවේග වල අතකොලු බවට පත්ව තිබේ. මෙය අන් කවර කලකටත් වඩා රාජපක්ෂ රෙජීමයේ පාලන සමයේදී සනාථව තිබේ. ප්‍රබුද්ධ සමාජය විසින් මෙම සංඝ කණ්ඩායම හැදින්වීම සදහා 'දේශපාලන අතකොළු, රාජපක්ෂ නිකාය" වැනි අන්වර්ථ යෙදුම් භාවිත කරන්නේ එබැවිනි.

මූලික වශයෙන් අධ්‍යයනය මගින් සාකච්ඡා කරන ලද භික්ෂු කණ්ඩායම ගිහි සමාජ සම්බන්ධතා වලට ලොල්වූ, වාණිජවාදයේ සරණ ගිය, ජාතික පිටස්තරවාදය ප්‍රවර්ධනය කරන, සිංහල ආධිපත්‍යය සදහා

ඇප කැප වූ සහ ආගම රැක ගැනීමේ නාමයෙන් ලේ හැලීමට වුවද සූදානම් වූ පිරිසකි. මොවුන්ගේ දේශනා මගින් කිසිවිටකත් ඉවසීම, අවිහිංසාව, බහුත්වවාදය, සහ විශ්ව සාධාරණත්වය වැනි ගුණාංග වලින් හෙබි සිවිල් සමාජයක් බිහිවීමේ හැකියාවක් නොමැත. පෙනෙන විදියට ඔවුන් අතින් එබන්දක් අනාගතයේදී බිහවීමේ ඉඩක් ද නැත. සිංහල- බෞද්ධ නොවන කිසිවෙකු හට ශ්‍රී ලංකාවෙහි සම අවස්ථා සහිත පුරවැසියන් වීමට ඉඩ නොදෙන පිටස්තරවාදී සහ සිංහල- බෞද්ධ ජාතිකවාදී මතවාදයක් බිහිව ඇත්තේ මේ හේතුවෙනි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සෙනෙවිරත්න, එච්.එල්. (2001). බුද්ධාගම,සංඝයා සහ සිවිල් සමාජය. *ප්‍රවාද*, කලාප 17, 37-49. ජයවර්ධන, ජයවර්ධන, කේ. (2000). බෞද්ධ විඥානය සහ ජනවාර්ගික ප්‍රශ්නය. *ප්‍රවාද*, කලාප 16, 63-70.

ලියනගමගේ, ඒ. (2010). *පූර්ව නූතන ශ්‍රී ලංකාව: සමාජය, රාජ්‍යය සහ ආගම*. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ගුණසිංහ, එන්. (2000). සංඝයාගේ සංකේතමය භූමිකාව. *ප්‍රවාද*, කලාප 16, 73-75.

ගුණවර්ධන, ආර්.ඒ.එල්.ඒ. (1993). *සිවුර සහ නගුල: මධ්‍යතන යුගයේ මුල් භාගය තුළ ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශවයන් පිළිබඳ අධ්‍යයනයක්*. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ධර්මදාස, කේ.එන්.ඕ. (2002). *ජාත්‍යානුරාගයෘ සමාජ ශාස්ත්‍රීය විමර්ශනයක්.* බොරලැස්ගමුවෘ විසිදුනු ප්‍රකාශකයෝ.

නවරත්න බණ්ඩාර, ඒ. එම්. (2001). *බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයෘ සිංහල බෞද්ධ ජාතිකවාදය සහ ජාතික සංගමය.* කොළඹ, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ප්‍රඥාරාම, වයි. (1970). *පැවිදි මග, සසුන් මග සහ අපේ ගමන්මග,* පෑලියගොඩ, විද්‍යාලංකාර සභාව.

උයන්ගොඩ, ජේ. (2018). භික්ෂූන්වහන්සේ සහ නව දක්ෂිණාංශික දේශපාලනය. *අනිද්දා* , 2018.07.01.

උයන්ගොඩ, ජේ. (2018). *දේශපාලනය සහ දේශපාලන විද්‍යාවෘ සමකාලින හැදින්වීමක්,* කොළඹෘ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

උයන්ගොඩ, ජේ. (2000). ශ්‍රී ලංකාවේ පශ්චාත්-විජිත දේශපාලනය තුළ ප්‍රතිසංස්කරණ විරෝධය ගැන විචාරාත්මක අවලෝකනයක්. *ප්‍රවාද,* කලාප 16, 17-29.

විතානවසම්, ඒ. (2019). *දේශපාලනය, රාජ්‍යය සහ ආණ්ඩුව.* මහරගමෘ තරංජි ප්‍රින්ටර්ස්.

රාහුල, ඩබ්. (2012). *භික්ෂුවගේ උරුමයෘ මුල්කාලයේ පටන් අද දක්වා භික්ෂූන්ගෙන් සමාජයට සිදුවූ සේවය පිළිබඳ ලුහුඩු ඉතිහාසයක්.* කොළඹෘ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Abeysekera, A. (2002). *Colors of the Robe: Religion, Identity and Difference*. Columbia: University of South Carolina Press.

Akimoto, T. (2020). *Buddhism Social Work in Sri Lanka: Past and Present*. Tokyo: Gakubunsha.

Arudpragasam, A. (2022). How the Rajapaksas Destroyed Sri Lanka Economy, *Foreign Policy*. 2022.04.28, Retrieved from www.foreignpolicy.com/ (Accessed Oct. 5, 2023).

Amunugama, S. (1985). Anagarika Dharmapala (1864-1933) and the Transformation of Sinhala Buddhist Organization in a Colonial Setting. *Social Science Information*, 24(4), 697-730.

Bartholomeusz, T.J., & De Silva, C.R. (2001). *The role of the Sangha in the Reconciliation*, London: Routledge.

Deegalle, M. (2006). *Buddhism, Conflict and Violence in Modern Sri Lanka*, London: Routledge.

De Silva, K.M. (1986). *Managing Ethnic Tension in Multi-ethnic Societies: Sri Lanka, 1880-1985*. Lanham: University Press of America.

De Silva, P. (2008). *Buddhism, State, and Monk: Sociological Study*. Colombo: Social Scientist Association.

DeVotta, N. (2007). *Sinhalese Buddhist Nationalist Ideology: Implications for Politics and Conflict Resolution in Sri Lanka*. Washington: East-West Center.

DeVotta, N. (2021). The Genesis Consolidation and Consequences of Sinhalese Buddhist Nationalism, *Research Gate*, May 2021, Retrieved from https://www.researchgate.net. (Accessed April 20, 2024).

Dewasiri, N.R. (2016). *New Buddhist Extremism and the Challenges to Ethno-Religious Coexistence in Sri Lanka*, Colombo: International Center for Ethnic Studies.

Edirisuriya, P. (2017). The rise and grand fall of Sri Lanka's Mahinda Rajapaksa: The end of era. *Asian Survey.* 57(2), 211-228.

Frydenlund, I. (2005). The Sangha and its relation to the peace process in Sri Lanka, *Peace Research Institute Oslo*. 2004-Feb. 2005, Retrieved from http://www.prio.org. (Accessed Sept. 15, 2023).

Gombrich, R. F., & Obeysekera, G. (1988). *Buddhism Transformed: Religious Change in Sri Lanka*. Princeton: Princeton University Press.

Grant, T. (2014). *Sri Lanka's Secrets: How the Rajapaksha regime gets away with murder*. Melbourne, Monash University Press.

Hettiarachchi, N. (2017). Role of Buddhist Monks in the Post-Conflict Reconciliation Process: The Case of Sri Lanka, In *Post-War Peace Building and Development in Sri Lanka*, Upali Pannilage (Eds.), 91-112, Gampola: Sitmini International Publishers.

Kearney, R.N. (1976). Religion and Politics in Sri Lanka. *The Journal of South Asian Studies*, 37(03), 597-598.

Kemper, S. (1991). *The Presence of the Past: Chronicles, Politics, and Culture in a Sinhalese Life*. Cornell: Cornell University Press.

Kumar, S.Y.S. (2018). *Ballots, Bullets and Bhikkhus: The role of the Buddhist Sangha in Sri Lankan Politics and Ethnic Politics*. New Delhi: Viva Books.

Malalgoda, K. (1976). *Buddhism in Sinhalese Society 1750-1900: A Study of Religious Revival and Change*. London: University of California Press.

Mukerji A. (2015). Sri Lanka correcting the wayward state. *World Affairs*, 19(2), 60-71.

Obeysekera, G. (1989). The Myth of Human Sacrifice: History, Story and Debate in a Buddhist Chronicle. *Social Analysis*.25, 78-93.

Obeysekera, G. (1972). Religious Symbolism and Political Change in Ceylon. *Modern Ceylon Studies*, 1(1), 156-169.

Phadnis, U. (1976). *Religion and Politics in Sri Lanka*. London: C. Hurst & Co.

Ramamurthy, A. (2022). The rise and fall of Sri Lankas powerful Rajapaksha dynasty. *DW*.

Retrieved from www.dw.com (Accessed Nov. 10, 2023).

Robert, M. (1979). *Collective Identities: Nationalism and Protests in Modern Sri Lanka*. Colombo. Marga Institute.

Scott, D. (1994). Religion in Colonial Civil Society: Buddhism and Modernity in 19th Century Sri Lanka. *Sage Journals*, Retrieved from https://journals.sagepub.com. (Accessed April 2, 2024).

Senevirathne, H.L. (2001). Buddhist Monks and Ethnic Politics: A War Zone in an Island Paradise. *Anthropology Today*, 17(2), 33-44.

Senevirathne, H.L. (1999). *The Work of Kings: The New Buddhism in Sri Lanka*. Chicago: University of Chicago Press.

Spencer, J. (1990). Tradition and Transformation: Recent Writing on the Anthropology of Buddhism in Sri Lanka. *Journal of the Anthropological Society of Oxford*, Vol. 21, 22.

Swaris, N. (2000). *Buddhism, Human Rights and Social Renewal*. Hong Kong: Asian Human Rights Commission.

Tambiah, S.J. (1992). *Buddhism Betrayed: Religion, Politics and Violence in Sri Lanka*. Chicago: University of Chicago Press.

Uyangoda, J. (ed.) (2007). *Religion in Context: Buddhism and Socio-Political Change in Sri Lanka*. Colombo: Social Scientist Association.

Vittachi, T. (1958). *Emergency 58*. London: Andre Deutsch Limited.

Weerawardana, I.D.S. (1960). *Ceylon General Election, 1956*. Colombo: M.D. Gunasena& Co.
Ltd.

Wickramasinghe, N. (2006). *Sri Lanka in the Modern age: A History of Contested Identities*.

London: C. Hurst & Co.

Wickremerathne, A. (1995). *Buddhism and Ethnicity in Sri Lanka: A Historical Analysis*. Delhi:

Vikas Publishing House.

Wijeratne, M. (1990). *Buddhist Monastic Life: According to the Texts of the Theravada Tradition*.

Cambridge: Cambridge University Press.

Wilson, A.J. (1974). *Politics in Sri Lanka: 1947-1973*. London: Billing & Sons Ltd.

Wriggins, H. (1960). *Dilemmas of New Nations*. Princeton: University of Princeton Press.